# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2025

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

**මාලිගාවත්ත, කොළඹ -10**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2025

**වැය ශීර්ෂ අංකය : 290**

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
011-2472187
dgdfar@gmail.com

<u>පටුන</u>


| | | පිටුව |
|---|---|---|
| **පරිච්ඡේදය 01-ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සංරාංශය** | | |
| 1.1 | හැඳින්වීම | **4** |
| 1.2 | ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | **4-5** |
| 1.3 | ප්‍රධාන කාර්යයන් | **5-6** |
| 1.4 | සංවිධාන ව්‍යූහය | **6-9** |
| 1.5 | සංවිධාන සටහන | **10** |
| **පරිච්ඡේදය 02-ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | | |
| 2.1 | 2025 වසරේ දෙපාර්තමේන්තු ප්‍රගතිය | **11-48** |
| 2.2 | විශේෂ ජයග්‍රහණ | **49-58** |
| 2.2 | අභියෝග | **59-60** |
| 2.3 | ඉදිරි ඉලක්ක | **61-62** |
| **පරිච්ඡේදය 03- 2025 වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය** | | |
| 3.1 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | **63-64** |
| 3.2 | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | **65-66** |
| 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | **67-68** |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සටහන් | **69** |
| 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | **70** |
| 3.6 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | **70** |
| 3.7 | මු. රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරනු ලබන ප්‍රතිපාදන | **71** |
| 3.8 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරිමේ කාර්ය සාධනය | **72** |
| 3.9 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | **72** |
| **පරිච්ඡේදය 04-කාර්යසාධන දර්ශක** | | |
| 4.1 | ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | **73-76** |
| **පරිච්ඡේදය 05-තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය** | | |
| 5.1 | හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු | **77-80** |
| 5.2 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | **81-83** |
| **පරිච්ඡේදය 06-මානව සම්පත් පැතිකඩ** | | |
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | **84-86** |
| 6.2 | ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම | **86-87** |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | **88-101** |
| **පරිච්ඡේදය 07-අනුකූලතා වාර්තාව** | | **102-108** |

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1. හැඳින්වීම

ධීවර අමාත්‍යාංශය යටතේ පවතින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයභාරයන් වනුයේ 1979 අංක 59 දරණ ධීවර (විදේශ ධීවර යාත්‍රා) පනත, 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත හා ඒ යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීමත්, වර්තමාන ප්‍රවණතා සහ ජාත්‍යන්තර සාගර නීති, සම්මුතීන්ට අනුකූලව කළ යුතු සංශෝධන හා නව නියෝග හඳුන්වා දීම මගින් ධීවර කර්මාන්තය කළමනාකරණය හා නියාමනය කිරීම ය.

එසේම, ධීවර කර්මාන්තයේ සංවර්ධනය උදෙසා නව තාක්ෂණය හඳුන්වා දීම ද, පසු අස්වනු හානිය අවම කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ද, අපනයන හා දේශීය පරිභෝජනය සඳහා වන මත්ස්‍ය නිෂ්පාදනවල තත්ත්වය සහ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට අදාළ වැඩිදියුණු කිරීම ද, ධීවර කුටුම්භයන්හි සමාජ හා ආර්ථික තත්ත්වය නංවා ගැනීම සඳහා ධීවරයින් සහ ධීවර කාන්තාවන් සවිබල ගැන්වීම ද ප්‍රමුඛ කාර්යයන් අතරට ඇතුළත් වේ.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

ධීවර සහ ජලජ සම්පත් තිරසරභාවයෙන් යුක්තව පවත්වා ගනිමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ථ දායකත්වයක් ලබා දීම

**මෙහෙවර**

ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය හරහා ශ්‍රීලංකා ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබාදීම සඳහා ජාතික හා ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව නව තාක්ෂණික ක්‍රමවේදයන්අනුගමනය කරමින් ධීවර සහ ජලජ සම්පත් කළමනාකරණය කිරීම

### 1.2.1. අරමුණු

- දේශීය, ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධීවර කටයුතු කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනය
- ධීවර ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ආයෝජන දිරි ගැන්වීම
- දේශීය සහ ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙලීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම
- ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්හි තත්ත්වය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම
- පසු අස්වනු නාස්තිය අවම කිරීම සහ දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම
- අන්තර්ජාතික ප්‍රඥප්ති සහ කලාපීය සම්මුතීන්ට අනුකූලව ධීවර මෙහෙයුම් සිදු කරන බවට සහතික වීම
- වරාය රාජ්‍ය පියවරයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව වරාය සේවා ක්‍රියාත්මක කිරීම
- මහ මුහුදේ ධීවර කටයුතුවල යෙදෙන යාත්‍රාවල මෙහෙයුම් අධීක්ෂණය හා ආරක්ෂාව තහවුරු කිරීම
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ජනතාවට හා අනෙකුත් සේවාදායකයින් හට ප්‍රශස්ත සේවාවක් ලබා දීම
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ක්ෂේත්‍රයට අදාළ දත්ත තොරතුරු කඩිනමින් හා නිරවුල්ව ලබා ගත හැකි වීම

## 1.3. ප්‍රධාන කාර්යයන්

- ධීවර මෙහෙයුම් නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ධීවර කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ජලජීවී වගා කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම, උකස් කිරීම හා ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම
- සජීවී මසුන් අපනයනය ආනයනය හා ප්‍රතිඅපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම
- මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ආනයන, අපනයනය හා ප්‍රතිඅපනයනය ආයතන ලියාපදිංචිය හා එම ආනයනය අපනයන නියාමනය කිරීම
- ඉහළ වාණිජ අගයකින්යුත් මසුන් හා ජලජ සම්පත් කළමකණාකරනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම
- විදේශීය ධීවර යාත්‍රා සඳහා මසුන් ගොඩ බෑම පිණිස බලපත්‍ර නිකුත් කිරීම
- ධීවර කළමනාකරණය පිළිබඳ ධීවර ජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම
- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම, නියාමනය සහ අධීක්ෂණය කිරීම

- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ධීවර සමිති කාර්යක්ෂම මට්ටමට ගෙන ඒම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීම
- ජාතික ධීවර සම්මේලනය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ධීවර සංවිධාන සම්බන්ධීකරණය සහ අධීක්ෂණය
- ධීවර කර්මාන්තයට අදාළ දත්ත රැස් කිරීම
- විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගැනෙන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- මුහුදේ විපතට පත්වන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- අපනයන කරනු ලබන මසුන් තත්ත්ව පරීක්ෂණයකට භාජනය කිරීම
- මසුන් සකස් කිරීමේ ස්ථාන ලියාපදිංචි කිරීම සහ මත්ස්‍ය අපනයන සඳහා ස්වස්ථා සහතික නිකුත් කිරීම
- දේශීය පරිභෝජනය සඳහා මසුන් වෙළඳාම් කරන ස්ථානවල තත්ත්වය උසස් කිරීම
- ධීවර කර්මාන්තයට එක් වූ බහුදින යාත්‍රා සඳහා යාත්‍රා නිරීක්ෂණ උපකරණ සවි කිරීම
- ධීවර යාත්‍රා සහගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන පහසුකම් ලබා දීම
- දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබා ගැනීම
- දිනපතා කාලගුණ වාර්තා සහ අයහපත් කාලගුණික පූර්ව තොරතුරු දෛනිකව ලබා දීම
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් ලබා දෙන තොරතුරු අනුව යාත්‍රා දැනුවත් කිරීම
- අනවසර විදේශීය ධීවර යාත්‍රා සහ කාර්මිකයින් පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම
- ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර සහඇමතුම් සංඥා ලබා දීමට කටයුතු කිරීම
- ධීවර කාර්මිකයින් සහයාත්‍රාවන් සම්බන්ධ අනතුරුවල දී රක්ෂණය සඳහා තොරතුරු සනාථ කර දීම
- අන්තර්ජාතික මුහුදු සීමාවන්හි පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම
- ධීවර පවුල්වල සාමාජිකයන්ගේ වෘත්තීය අධ්‍යාපනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ධීවර කාර්මික රක්ෂණය සහ විශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මගින් ධීවර සමාජ ආරක්ෂණය
- කලපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ධීවර ගම්මානවල යටිතලපහසුකම් සංවර්ධනය
- ධීවර කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති

## 1.4. සංවිධාන ව්‍යුහය

ධීවර අමාත්‍යාංශය යටතේ පවතින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල්වරයකු මගින් පාලනය වේ. එම කටයුතු වඩාත් සඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු ද පත් කර ඇත. දෙපාර්තමේන්තුවේ කාර්යයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීමේ පහසුව සළකා ප්‍රධාන කාර්යාලයේ කටයුතු අංශ 09කට බෙදා වෙන් කර තිබේ.

එනම්,

1. කළමනාකරණ අංශය
2. සංවර්ධන අංශය
3. තත්ත්ව පාලන අංශය
4. ධීවර මෙහෙයුම් අංශය
5. විමර්ශන හා පුහුණු අංශය
6. තොරතුරු හා තාක්ෂණ අංශය
7. පාලන අංශය
8. ගිණුම් අංශය
9. අභ්‍යන්තර විගණන අංශය

මෙම අංශවල කටයුතු මෙහෙයවීම අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකු, ප්‍රධාන ගණකාධිකාරි හා ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් ඉටු වේ.

දිවයිනේ මුහුදුබඩ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ කාර්යාල 15ක් පිහිටුවා තිබෙන අතර, එක් එක් දිස්ත්‍රික්කයේ කටයුතු එම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරයාගේ මෙහෙය වීම යටතේ ඉටු වේ.

දිස්ත්‍රික්ක තුළ මුහුදුබඩ ප්‍රදේශ ආවරණය වන පරිදි ධීවර පරීක්ෂක කොට්ඨාශ 149ක් පිහිටුවා ඇත. ධීවර පරීක්ෂක, ධීවර සමාජ සංවර්ධන සහකාර, ධීවර සම්පත් කළමනාකරණ සහකාර, සංවර්ධන නිලධාරි සහ ධීවර නිලධාරි යන නිලධාරීන් විසින් මෙම ධීවර පරීක්ෂක කොට්ඨාශ තුළ සියලු ධීවර කටයුතු ක්‍රියාත්මක කෙරේ.

එසේම, ධීවර වරායන් ආශ්‍රිතව ප්‍රාදේශීය සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන 18ක් පිහිටුවා ඇති අතර ගුවන් විදුලි නිලධාරීන් දිවා-රාත්‍රී මෙම මධ්‍යස්ථානවල සේවයේ යොදවා ඇත. මෙම ප්‍රාදේශීය සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන මගින් මහ මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවුඩ හුවමාරු සම්බන්ධතාවය පැය 24 පුරා ම තබා ගැනීමට කටයුතු කර ඇත. එමගින්, යාත්‍රා සඳහා කාලගුණ වාර්තා හා හදිසි පූර්ව අනතුරු ඇඟවීම් ද දෛනිකව ලබාදෙන අතර, යාත්‍රා හිමියන්ගේ පණිවුඩ ලබා දීම හා ධීවර කාර්මිකයින්ගේ පණිවුඩ ලබා ගැනීම් ද සිදු කරනු ලබයි. තවද, ධීවර යාත්‍රාවලින් ලැබෙන හදිසි ආපදා පණිවුඩ සඳහා එම අවස්ථාවේ සිට එම කාර්යය අවසන් වන තෙක් අවශ්‍ය සියලු කටයුතු සිදු කරනු ලබයි. මෙම සියලු කාර්යයන් කොළඹ ප්‍රධාන කාර්යාලයේ පිහිටි සෝදිසි මෙහෙයුම් මැදිරිය විසින් සම්බන්ධීකරණය කරනු ලබයි.

ඊට අමතරව,දිස්ත්‍රික්ක 07ක පිහිටි ධීවර වරායන් 25ක වරාය කාර්යාල පිහිටුවා ඇති අතර ධීවර නිලධාරි සහ සංවර්ධන නිලධාරි යන නිලධාරීන් විසින් දිවා-රාත්‍රී වරායෙන් පිටත්වන යාත්‍රා පරික්ෂා කිරීම, පිටත්වීම ලියාපදිංචිය හා අවසර ලබා දීම, වරායට පැමිණෙන ධීවර යාත්‍රා ගමන් වාරයට අදාළ ලොග් සටහන ලබා ගැනීම, මත්ස්‍ය අස්වැන්න පරික්ෂාව, අපනයනයට නියමිත මත්ස්‍ය තොග සඳහා වාර්තා සකස් කර ගැනුම්කරුවන්ට ලබා දීම, නීති විරෝධී, වාර්තා නොවූ හා අවිධිමත් ධීවර කටයුතු සිදු වී තිබේ නම් ප්‍රකාශ ලබා ගැනීම, ලොග් සටහන් සහ ලබා ගත් ප්‍රකාශ ෆැක්ස් හා ඊමේල් මගින් ප්‍රධාන කාර්යාලය වෙත ලබා දීම සහ විකල්ප නිරීක්ෂණ වාර්තා සකස් කිරීම ආදී කටයුතු සිදු කෙරේ.

ජාත්‍යන්තර මුහුද වෙත මසුන් මැරීම සඳහා යන සියලු බහුදින යාත්‍රා,චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ අධීක්ෂණය කිරීම අන්තර් ජාතික නීතිරීති වල අනිවාර්යය අංගයකි. ඒ අනුව, 2015 වර්ෂයේ සිට ජාත්‍යන්තර මුහුදේ මෙහෙයුම් බලපත්‍ර ලබා ගත් යාත්‍රා පමණක් යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් (VMS) මගින් නිරීක්ෂණය කළ ද, ඉහත ජාත්‍යන්තර නීතිරීති සහ මත්ස්‍ය අපනයන අවශ්‍යතාව අනුව සියලුම බහුදිනයාත්‍රා යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය(VMS) මගින් ආවරණය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගිණි. බහුදිනයාත්‍රා මගින් සිදු කරන ධීවර නොවන අනෙත් නීතිවිරෝධී කටයුතු (උදා:නීතිවිරෝධී සංක්‍රමණ සහ මත්ද්‍රව්‍ය ප්‍රවාහන කටයුතු) හඳුනා ගැනීමේ වියදම් අඩු ක්‍රමවේදයක් ලෙස ද මෙම අවශ්‍යතාවය මතු වීතිබිණි.

ඒඅනුව, ඉහත අවශ්‍යතාවයට සරිලන යාත්‍රා නිරීක්ෂණ පද්ධති (VMS) ඒකක 4200කින් සමන්විත සම්පූර්ණ යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රදානයක් ලෙස දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

නව යාත්‍රා නිරීක්ෂණ පද්ධතියට (VMS), සියලුම වරාය කාර්යාල හරහා ප්‍රවේශවීමේ හැකියාව පවතින අතර ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටා ඇති ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) මගින් 24x7 පුරා මධ්‍යගතව එම කටයුතු කළමනාකරණය කරයි. නීතිවිරෝධී ධීවර කටයුතු, මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ නීතිවිරෝධී දේශ සීමාතරණය වැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් සිදු විය හැකි අවදානම් යාත්‍රා හඳුනා ගැනීම මෙම මධ්‍යස්ථානය සතු පහසුකම් මගින් සිදු කළ හැකි ය. එමෙන්ම, හදිසි ආපදා තත්ත්වයන්හි දී ධීවර යාත්‍රා සඳහා පහසුකම් සැලසීමට ද මෙම පද්ධතිය යොදා ගත හැකි ය. මෙම ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය, සියලු නවීන තාක්ෂණය භාවිතයෙන් නවීකරණය කර ඇති අතර, වර්තමානයේදී මෙය ආසියාවේ ඇති අති නවීන අධීක්ෂණ මධ්‍යස්ථානයක් ලෙසද සැළකිය හැකි ය.

එසේම, යාත්‍රා නිරීක්ෂණ ඒකකය, ධීවර මෙහෙයුම් අංශය සහ ධීවර වරායන්වල පිහිටුවා ඇති අන්තර්ජාතික ධීවර කටයුතු ඒකක සමඟ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක වන උප කාර්යාලයක්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි පිහිටුවා ඇත. මෙම කාර්යාලය මගින් ධීවර නිෂ්පාදන අපනයනයේ දී, විශේෂයෙන් ම, යුරෝපා සංගමයට අයත් රටවල් සඳහා අපනයනයේ දී සෑම මත්ස්‍ය තොගයක් සඳහා ම මසුන් ඇල්ලීමේ සහතික (Catch Certificates) නිකුත් කිරීම සහ ධීවර නිෂ්පාදන ප්‍රතිඅපනයනය සඳහා මසුන් ආනයනයේ දී අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදු කරනු ලබයි. දිනපතා ගුවන් මගින් සිදු කරනු ලබන අපනයනයන් සඳහා අවශ්‍ය සහතික කඩිනමින් සහ ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීමේ පහසුව සඳහා තත්ත්ව පාලන ඒකකයක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ස්ථාපනය කර ඇති අතර, එය පැය 24 පුරාවට ම (24x7) විවෘතව පවතී.

ගොඩබිමට පැමිණෙන සෑම බහුදින යාත්‍රාවක ම සම්පූර්ණ ගමන් වාරය පිළිබඳව පිහිටීමේ තොරතුරු සහිත යාත්‍රා නිරීක්ෂණ පද්ධතියේ (VMS) ගමන් මග එම යාත්‍රාවට අදාළ ලොග් පිටුව සමඟ පරීක්ෂා කිරීමෙන් පසු යාත්‍රා නිරීක්ෂණ පද්ධතියේ (VMS)දත්ත සමඟ සැසඳේ නම් පමණක් එම මත්ස්‍ය තොගය අපනයනය කිරීමට හැකි වන ලෙසත් මෙම යාත්‍රාව කිසිඳු නීතිවිරෝධී ධීවර කටයුත්තක් සිදු නොකොට නීත්‍යානුකූලව මසුන් අල්ලා ගෙන පැමිණි යාත්‍රාවක් බවටත් සහතික කර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සත්‍යාපන වාර්තාවක් නිකුත් කරනු ලබයි. මෙම සත්‍යාපන වාර්තාව, කටුනායක පිහිටි ගුවන්තොටුපල තත්ත්ව පාලන ඒකකය වෙත යොමු කිරීමෙන් පසුව යාත්‍රාවේ එම ගමන් වාරයට අදාළ මසුන් සඳහා අපනයනය කිරීමට අවශ්‍ය ඇල්ලුම් සහතිකය (Catch Certificate) නිකුත් කරනු ලබයි. මෙම මත්ස්‍යතොරතුරු සත්‍යාපන ක්‍රියාවලිය, පැය 24පුරා ම ආවරණය වන පරිදි සතියේ දින 07 පුරා දිවා-රාත්‍රී (24x7) ක්‍රියාත්මක කිරීමේ කටයුතු, වරාය මෙහෙයුම් කාර්යාල (21ක්), කොළඹ ප්‍රධාන කාර්යාලයේ පිහිටි යාත්‍රානිරීක්ෂණ ඒකකය, ජාත්‍යන්තර ධීවර කටයුතු ඒකකය හා කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපලේ ඇති තත්ත්ව පාලන ඒකකය යන කාර්යාලවල සිදු කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය හේතුවෙන්, බහුදින යාත්‍රාමගින් දිවයිනට රැගෙන එනු ලබන නීත්‍යානුකූල මත්ස්‍ය තොග නියමිත පරිදි වාර්තා සහිතව සහ බලපත්‍ර සහිතව අල්ලා ගන්නා ලද ඒවා බවට සහතික කොට අපනයනය සඳහා යොමු කිරීමට අවස්ථාව හිමි වේ.

## 1.5 දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



# 2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 2025 වසරේ දෙපාර්තමේන්තු ප්‍රගතිය

### සංවර්ධන අංශය

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දීම සඳහා කාර්යක්ෂම සහ පරිසර හිතකාමී නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම, විධිමත් කිරීම මගින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම හා ධිවර ප්‍රජාවගේ සමාජීය, ආර්ථික හා සමාජ සුබසාධක තත්වය ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගැනීම ධීවර සංවර්ධන අංශයේ ප්‍රමුඛතම වගකීම වේ.

සංවර්ධන අංශයේ මූලික කාර්යභාරය

- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම නියාමනය හා අධීක්ෂණය කිරිම
- ධීවර යාත්‍රා සැලසුම් සඳහා අනුමැතිය ලබා දීම
- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ධීවර ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරීම
- වෙරළාශ්‍රිත ඉදි කිරීම් ව්‍යාපෘතිවලට අදාලව පාරිසරික ඇගයීම් වාර්තා සඳහා ධීවර කර්මාන්තයන්ට බාධාවක් නොවන පරිදි නිර්දේශ ලබාදීම.
- ධීවර ක්ෂේත්‍රයට අදාල යටිතල පහසුකම් සංවර්ධනය.
- විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ධීවර සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ධීවර කාර්මික රක්ෂණය ක්‍රියාත්මක කිරීම.
- ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරිම මගින් ධීවර සමාජ ආරක්ෂණය තහවුරු කිරීම.
- ධීවර වන්දි ලබා දීම පිළිබඳ කටයුතු කිරීම.
- දියවර කැකුළු ළමා ඉතුරුම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- කලපු පරිසර පද්ධතිය සංවර්ධනය හා සංරක්ෂණය විධිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- කලපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම.
- සියලුම දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කරමින් ප්‍රගති සමාලෝචනය කිරීම.
- විශේෂ ධීවර ගැටළු නිරාකරණය කිරීම.

**ධීවර කාර්මිකයින්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම**

| කාර්යය | 2025.12.31 දක්වා ප්‍රගතිය |
|---|---|
| රක්ෂණය කරන ලද සමස්ථ ධීවර යාත්‍රා සංඛ්‍යාව | 25,832 |
| රක්ෂණය කරන ලද සමස්ථ ධීවර කාර්මිකයින් සංඛ්‍යාව | 12,842 |
| මුහුදු යෝග්‍යතා සහතික නිකුත් කිරීම් | 32,990 |
| ධිවර යාත්‍රාංගන ලියාපදිංචි කිරීම් | 48 |
| ධිවර ආම්පන්න හා ධිවර උපකරණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම | 17 |
| මත්ස්‍ය ඇම සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම | 04 |
| බෝට්ටු එන්ජින් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම | 12 |
| ස්වාභාවික විපත් සඳහා වන්දි ලබා දීම් | 02 |
| දියවර කැකුළු ළමා ඉතුරුම් ගිණුම් විවෘත කිරිම් | 818 |
| නිකුත් කර ඇති මුළු ධිවර හැඳුනුම්පත් සංඛ්‍යාව | 1973 |
| නිකුත් කර ඇති මුළු යාත්‍රා නියමු බලපත්‍ර සංඛ්‍යාව | 1044 |

**ආර්ථික අර්බුදය හේතුවෙන ධීවර කර්මාන්තයට ඇති වී ඇති බලපෑම අවම කර ධීවර කර්මාන්තය යථාවත් කිරීමේ වැඩසටහන**

ආර්ථික අර්බුදය හේතුවෙන ධීවර කර්මාන්තයට ඇති වී ඇති බලපෑම අවම කර ධීවර කර්මාන්තය යථාවත් කිරීමේ වැඩසටහනයටතේමේ වන ධීවර දිස්ත්‍රික්ක 15 ට අදාලව 2024 ඔක්තෝබර්,නොවැම්බර්, දෙසැම්බර්, 2025 ජනවාරි,පෙබරවාරි හා මාර්තු වලට අදාලව OFRP,IMUL,I DAY,MTRB යාත්‍රා හිමිකරුවන් සඳහා රුපියල් 1,926,056,968.01 ක මුදලක් බෙදා දී ඇත

**ධීවර තොටුපලවල ආරක්ෂාව වැඩිදියුණුකිරීම**

ධීවර තොටුපල ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අරමුණු කොටගෙන බීකන් පහන් හා විදුලි පහන් සවිකිරීමේ ව්‍යාපෘතියට අදාලව බීකන් පහන් 67 මිලදීගෙන.
තවද ඉදිරියේදී මීට අමතරව බීකන් පහන් 22 ක් හා විදුලි පහන්ද මිලදීගෙන අවසන් කර ඇති අතර බීකන් පහන් කණු 16ක් දැනට ඉදිකර අවසන්ව ඇත

**ස්වභාවික විපත් හේතුවෙන් වෙරළාසන්න ධීවර කර්මාන්තයට සිදු වන බාධා වීම් හේතුවෙන් ධීවර කර්මාන්තයට වන බලපෑම් අවම කිරීම (යටිතල පහසුකම් සංවර්ධනය /2090-1-1-13-2506)**

ධීවර දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මකවන සුළුපන්න ධීවර යාත්‍රාවල ගමන් මාර්ගය පහසු කිරීමේ අරමුණින්, ඇළමාර්ග/ මෝය කටවල් පිරිසිදු කර සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ඇළ මාර්ග දෙකක් පිරිසිදු කර අවසන්ව ඇත

**නව ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ ලෝක ධිවර දිනයට සමගාමීව ධිවරයින් 22ක් බඳවා ගනිමින් නව ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ආරම්භ කර ඇත .
දැනුවත් කිරීමේ වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කිරීම මගින් සියලු ධිවර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දෙපාර්තමේන්තු නිලධාරින් මේ පිලිබඳව දැනුවත් කර ඇත

**උතුරු හා නැගෙනහිර පළාත් වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ පෙර සැකසූ නිවාස 500ක් ලබාදීමේ වැඩසටහන**

චීන සමූහාණ්ඩු ආධාර යටතේ ශ්‍රී ලංකා රජයට රුපියල් මිලියන 750ක වටිනාකමකින් යුත් පෙර සැකසූ නිවාස 500ක් පරිත්‍යාග කර ඇති අතර එම පෙර සැකසූ නිවාස යාපනය, කිලිනොච්චි, මඩකලපුව, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය හා කල්මුණේ යන දිස්ත්‍රික්ක තුළ සක්‍රීය ධීවර කර්මාන්තයේ නියැලෙන අඩු ආදායම්ලාභී ධීවර කාර්මිකයින් සඳහා ඉදිකර දීමට නියමිතය. මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක වලට අනුකූලව, සියලුම දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන් හඳුනා ගැනීම අවසන්ව ඇත. පෙරසවි නිවසේ පාදම සකස් කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය මිළදී ගැනීමේ කටයුතු හා පාදම සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.



මඩකලපුව දිස්ත්‍රික්කය



කිලිනොච්චි දිස්ත්‍රික්කය

**උතුරු හා නැගෙනහිර පළාත් වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ සහල් සහනාධාර ලබාදීමේ වැඩසටහන 2024-2025**

වර්ෂය අවසානයේදී චීන රජය විසින් ලබාදුන් රුපියල් මිලියන ක වටිනකමින් යුත් සහල් මෙට්‍රික් 555.40 ටොන් 1,630යාපනය, කිලිනොච්චි, මඩකලපුව, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය හා කල්මුණේ යන දිස්ත්‍රික්ක වල අඩු අදායම්ලාභී ධිවර පවුල් වෙත බෙදා අවසන් කර ඇත.

**උතුරු හා නැගෙනහිර පළාත් වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ මත්ස්‍ය දැල් 75000ක් ලබාදීමේ වැඩසටහන 2024-2025**

| ප්‍රතිලාභීන් සංඛ්‍යව | බෙදාදුන් දැල් සංඛ්‍යාව |
|---|---|
| **11,428** | 68568 |

**කලපු සංවර්ධනය**

**කලපු කළමණාකරණ කමිටු**

කලපු කළමණාකරණ පිළිබඳ ධිවර ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

| ධිවර දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යව |
|---|---|
| හලාවත | 4 |
| මිගමුව | 4 |
| පුත්තලම | 1 |
| ගාල්ල | 3 |
| කල්මුනේ | 2 |

**කලපු මායිම් කණු සිටුවීම**

| ධිවර දිස්ත්‍රික්කය | සිටවූ කණු සංඛ්‍යව | වැයවූ මුදල |
|---|---|---|
| පුත්තලම | 740 | රු .1,133,870.00 |
| හලාවත | 141 | රු. 176,250.00 |
| වැයකළ මුළු මුදල | | රු. 1,310,120.00 |

## විමර්ශන හා පුහුණු අංශය

**ධීවර ප්‍රජාව, ධීවර නිළධාරී හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ මනා සබඳතාවයක් ගොඩනැඟීම**

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය නීති විරෝධී,අවිධිමත් හා වාර්තා නොවන ධීවර කටයුතු වලින් තොරව,ධීවර සම්පතෙහි තිරසාර පැවැත්ම තහවුරු කිරීම සඳහා 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම විමර්ශන අංශයේ ප්‍රමුඛතම අරමුණ වේ.

නව තාක්ෂණය යොදා ගනිමින් ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව සම්පත් කළමනාකරණය තුළින් ශ්‍රී ලංකා ජාතික ආර්ථිකයට ඵලදායි දායකත්වයක් ලබාදීම සඳහා ධීවර කර්මාන්තය තිරසාර ලෙස සංවර්ධනය කිරීමද  අරමුණ වේ.

අනාගත පරපුර සඳහා ධීවර සම්පත් ආරක්ෂා කර ගැනීම උදෙසා ධීවර ප්‍රජාව, ධීවර ක්ෂේත්‍රය නියාමනය සිදු කරන ධීවර නිළධාරීන් සහ ධීවර ක්ෂේත්‍රයට අදාලවන අනෙකුත් පාර්ශවකරුවන් දැනුවත් කිරීම සහ **පුහුණු කිරීමත්අරමුණ වේ.**

**විමර්ශන හා පුහුණු අංශයේ කාර්යභාර්ය**

**විමර්ශන ඒකකය**

- වාර්ෂික වැටලීම්/ පරික්ෂා කිරීම් සම්බන්ධ සැලසුම් සකස් කිරීම
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් හඳුනා ගන්නා ලද නීති කඩකිරීම් සඳහා වන විමර්ශන කටයුතු සිදු කිරීම
- නීති විරෝධී ධීවර කටයුතු වැටලීම් සඳහා දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්ට අනුමැතින් ලබා දිම දිස්ත්‍රික් මට්ටමේ පරීක්ෂණ, වැටලීම් හා විමර්ශන කටයුතු අධීක්ෂණය කිරීම.
- සමථකරණ කටයුතු පරිපාලනමය දඩ අය කිරීම් මණ්ඩලය රැස් කිරීම සහ පරිපාලන දඩ අය කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය
- ධීවර යාත්‍රාංගන, ධීවර ආම්පන්න නිෂ්පාදන සැපයුම් හා ඇම සැපයුම් ආයතනවල පරික්ෂා කිරීම්/ වැටලීම් සිදු කිරීම
- ධීවර නිෂ්පාදන පිරිසැකසුම් හා සැපයුම් ආයතන පරීක්ෂා කිරීම් හා වැටලීම් සිදු කිරීම
- ගුවන් විදුලි මධ්‍යස්ථාන සහ අන්තර්ජාතික ධීවර කටයුතු ඒකක පරීක්ෂා කිරීම /විමර්ශනය කිරීම
- විශේෂ විමර්ශන ප්‍රකාශයට පත් කිරීම සඳහා හදිසි කැඳවුම් නියෝග නිලධාරීන්ට ලබා දීම
- සියලුම විමර්ශන සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයක් සිදු කිරීම
- රාජ්‍යය බුද්ධි අංශය සහ වෙනත් ආයතන මගින් ක්‍රියාත්මක කෙරෙන විමර්ශන සඳහා ඉල්ලුම් කරනු ලබන තොරතුරු වාර්තා ලබා දීම

**පුහුණු ඒකකය**

- දෙපාර්තමේන්තුවේ වාර්ෂික පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන් සැලැස්ම සකස් කිරීම
- ජාතික මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමෙන් ධීවර කාර්මිකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩ සටහන් සංවිධානය කිරීම
- ධීවර යාත්‍රා නියමුවන් සඳහා පුහුණු පාඨමාලා සකස්කිරීම හා දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන නියමු පුහුණු වැඩසටහන් අධීක්ෂණය
- ධීවර යාත්‍රා නියමුවන්/ ධීවර කාර්මිකයින් සඳහා ප්‍රථමාධාර පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය
- ධීවර පවුල්වල සාමාජිකයින්ගේ වෘත්තිය අධ්‍යාපනය ඉහල නැංවීම, ධීවර කාන්තාවන් සඳහා විකල්ප අදායම් උත්පාදන වැඩසටහන් හා නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- විශ්ව විද්‍යාල කාර්මික විද්‍යාල වලින් ධිවර ක්ෂේත්‍රය පිළිබඳව කාර්මික/ සීමාවාසික පුහුණුව ලබා ගැනීම සඳහා යොමු කරන සිසුන් සඳහා පුහුණුව ලබා දීම හා සම්බන්ධීකරණය
- සියලුම නිලධාරීන් සඳහා දේශීය පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම
- පුහුණු වැඩ සටහන් හා දැනුවත් කිරීමේ වැඩ සටහන් සම්බන්ධ ප්‍රතිපෝෂණය හා විශ්ලේෂණය
- දැනුවත් කිරීම් සම්බන්ධ පත්‍රිකා, පොත් පිංච සහ වීඩියෝ පට නිර්මාණය සහ පිරිවිතරයන් සහ අත් පිටපත් (Script) සැකසීම.

**විමර්ශන හා පුහුණු අංශය - 2025.12.31 දක්වා ප්‍රගතිය**

**විමර්ශන ඒකකය**

| අනුඅංකය | අංශයේ කාර්යය | කාර්ය දර්ශක | අපේක්ෂිත ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|---|
| **1** | දිස්ත්‍රික්මට්ටමේ වැටලීම් සහ නීතී විරෝධී ධීවර කටයුතු වලට එරෙහි විමර්ශන හා නෛතික කටයුතුසූපරීක්ෂණය | දිස්ත්‍රික්මට්ටමේ නෛතික කටයුතු පිළිබඳව පවත්වා ගන්නා යාවත්කාලීන දත්ත වාර්තාව | නිශ්චිත ඉලක්ක ලබාදිය නොහැක | 713 |
| **2** | පරිපාලන දඩ පැනවීම සඳහා සියළු දිස්ත්‍රික් කාර්යාල වලින් යොමු වන ඉල්ලීම්, අදාලක්‍රියාවලියට අනුව පරිපාලන දඩ පැනවීම සඳහා යොමු කිරීම. | පරිපාලන දඩ පැනවීමට යටත් කරන ලද නඩු සංඛ්‍යාව | | 35 |
| **3** | යාත්‍රානිරීක්ෂණ පද්ධතිය මඟින් හඳුනාගන්නා ලද සැක කටයුතු සිදුවීම් සඳහා වන විමර්ශනකටයුතු සිදු කිරීම. | යාත්‍රානිරීක්ෂණ පද්ධතිය මඟින් හඳුනාගන්නා ලද සැක කටයුතු සිදුවීම් සඳහා වන විමර්ශන ගණන | | 889 |
| **4** | විශේෂවැටලීම් සිදු කිරීම. | සැලසුම්කරන ලද වැටලීම් ප්‍රමාණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිශතය | 3 | 2 |
| **5** | | 1.පරික්ෂාවන්ගණන | 14 | 08 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ධීවරයාත්‍රා, වරාය, ධීවර ආම්පන්න, නිෂ්පාදන සහ ධීවරඇම සැපයුම් ආයතන සම්බන්ධ පරීක්ෂා කිරීම් සහ විමර්ශන කටයුතු. | 2.නඩු පැවරීම් ගණන | නිශ්චිතඉලක්ක ලබාදිය නොහැක | 0 | |

**පුහුණු ඒකකය**

| අනුඅංකය | අංශයේ කාර්යය | කාර්ය දර්ශක | අපේක්ෂිත ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|---|
| **1** | අදාලපාර්ශවකරුවන්(stake holder) සඳහා ධීවර නීතිය සහ නීත්‍යානුකූල ධීවර යෙදවුම්පිළිබඳව දැනුවත් කිරීම් සිදු කිරීම. | අදාළ පාර්ශවකරුවන් (stake holder) දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 4 | 13 |
| **2** | දෙපාර්තමේන්තුවේනිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම. | නිලධාරීන් සඳහා සකස්කළ අදාළ වැඩසටහන් සංඛ්‍යාව | 44 | 35 |
| **3** | දිස්ත්‍රික්මට්ටමින් සිදු කරන ධීවර කාර්මික දැනුවත් කිරීම් සංවිධානය කිරීම. | දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 58 | 113 |
| **4** | දෙපාර්තමේන්තුවේනිළධාරීන් බාහිර ආයතන වල පැවැත්වෙන පුහුණු වැඩසටහන්/ පශ්චාත් උපාධි/ ඩිප්ලෝමාපාඨමාලා වෙත යොමු කිරීම. | බාහිර ආයතන සම්බන්ධීකරණය කරමින් සිදුකල පුහුණු කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 21 | 14 |
| **5** | විශ්වවිද්‍යාල /කාර්මික විද්‍යාල සිසුන් සඳහා කර්මාන්ත ක්ෂේත්‍ර පුහුණුව ලබාදීමසම්බන්ධ බාහිර අධීක්ෂක ලෙස ක්‍රියා කිරීම. | විශ්ව විද්‍යාල /කාර්මික විද්‍යාල සිසුන් සඳහා කර්මාන්ත ක්ෂේත්‍රපුහුණුව ලබාදීම සම්බන්ධ සමීක්ෂණය කල සංඛ්‍යාව | නිශ්චිත ඉලක්ක ලබාදිය නොහැක | 0 |




රූපය 4: විශේෂ වැටලීම් සිදු කිරීම පොකිරිස්සන් ඇල්ලීමට තහනම් කාලයේදී පොකිරිස්සන් අනවසරයෙන් සන්තකයේ තබා ගැනීම



රූපය 5: අදාල පාර්ශවකරුවන් (stake holder) සඳහා ධීවර නීතිය සහ නීත්‍යානුකූල ධීවර යෙදවුම් පිළිබඳව දැනුවත් කිරීම් සිදු කිරීම



රූපය 6: මැදවච්චිය, පූනෑව, ශික්ෂා නාවික හමුදා කඳවුරෙහි පුහුණු නාවික හමුදා නිළධාරීන් සඳහා පැවැත්වූ වැඩසටහන්

## තොරතුරු තාක්ෂණ අංශය

### අරමුණ

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ධීවර සම්පත් කළමනාකරණය කිරීම සඳහා මාර්ගගත යෙදුමක් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමයි. දෙපාර්තමේන්තු ජාලය නඩත්තුකිරීම, මාර්ගගත යෙදුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම, අදාළ දෘඩාංග හැසිරවීම, පුළුල් දත්ත විශ්ලේෂණය හා වාර්තා කිරීම, තොරතුරු තාක්‍ෂණය පිළිබඳ පුහුණුව ප්‍රධාන අවධානය යොමු කළයුතු අංශවේ. එසේම 24*7 රාජකාරී කටයුතු සිදු කරන බහුදින යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය ද මෙම අංශය හරහා ක්‍රියාත්මක වනු ලැබේ.

### ප්‍රධාන ක්‍රියාකාරකම්

- දෙපාර්තමේන්තු සේවාදායකයන් තුළ දෙපාර්තමේන්තු ජාල මෘදුකාංග ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය.
- දෙපාර්තමේන්තු ජාලය සහ මූලික තොරතුරු තාක්ෂණය පිළිබඳ නිලධාරී පුහුණුව.
- ගතික වාර්තාකරණ පද්ධතිය හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුව සඳහා දෘඩ පද්ධතිය නඩත්තු කිරීම.
- කාර්යමණ්ඩල පාදක නිරීක්ෂක පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- දෙපාර්තමේන්තු පරිගණක දෘඩාංග හා මෘදුකාංග නඩත්තු කිරීම.
- තාක්ෂණික ගැටළු තත්‍යකාලීනව විසඳීම සඳහා Inquiry Management System ක්‍රියාත්මක කිරීම.
- සර්වර් පද්ධතිය Cloud server වෙත මාරු කිරීම.
- “Ditwah” සුළි කුනාටුව නිසා ධීවර ප්‍රජාව වෙත සිදු වූ ආපදාවන් ඇතුළත් කිරීම සඳහා මාර්ගගත disaster management system ක්‍රියාත්මක කිරීම.
- කුඩා පරිමාණ යාත්‍රා නිරීක්ෂණය සඳහා යාත්‍රානිරීක්ෂණ පද්ධතියක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම.
- IT Consultation හරහා දෙපාර්තමේන්තුගත පද්ධතීන් අධීක්ෂණය හා මෘදුකාංග සංවර්ධනය
- නිලදාරීන්ට අතිකාල දීමනා ගෙවීම සඳහා මාර්ගගත පද්ධතියක් (Online OT System) ආරම්භ කරන ලදි.
- KPI (Key Performance Indicator) සඳහා පද්ධතියක්, නිවාඩු කළමනාකරණ පද්ධතියක් (Leave Management System) අත් හදා බැලීමක් ලෙස ආරම්භ කරන ලදි.
- Online Payment Portal ක්‍රියාත්මක කිරීම.

දෙපාර්තමේන්තුවේ සේවාවන් ජාලගත මෘදුකාංගය මගින් ක්‍රියාත්මක කිරීම.




රූපය : MSDFAR

දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය සංවර්ධනය කරනුයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් 34 කට වැඩි ප්‍රමාණයක් ඩිජිටල් ක්‍රියාවලියක් බවට පරිවර්තනය කිරීමටයි.

ධීවරයින් ලියාපදිංචි කිරීම, බෝට්ටු ලියාපදිංචි කිරීම, විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම යනාදිය හා තවත් බොහෝ ක්‍රියාදාමයන් ඊට ඇතුළත්ය. මෙම යෙදුම දැනට Cloud සර්වර් පද්ධතියක් තුළ ක්‍රියාත්මක වන අතර එය http://msdfar.com භාවිතයෙන් ප්‍රවේශවිය හැකිය. යෙදුම ට අදාල දැනටමත් නිලධාරී මාර්ගගත පිවිසුම් 700කට වඩා ස්ථාපනය කර ඇති අතර අනුවාද යාවත්කාලීන කිරීම් කිහිපයක් සිදු කර ඇත. දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය භාවිතා කරමින් ධීවරයින් 62,000 ක්, යාත්‍රාංගන 99ක් (පැරණි දත්ත ඇතුළුව), බෝට්ටු 31,000කට වැඩි ප්‍රමාණයක්, නියමුවන් 7300ක් දැනටමත් ලියාපදිංචි කර ඇති අතර මෙම වසර තුල පමණක් මෙහෙයුම් බලපත්‍ර 7,000කට වැඩි ප්‍රමාණයක් නිකුත්කර ඇත. නිකුත් කල මුළු බලපත්‍ර ප්‍රමාණය 15000 ඉක්මවා ඇත. 2024 වර්ෂය සඳහා මාර්ගගත පිටත්කිරීමේ පද්ධතිය හරහා මාර්ගගත පිටත්කිරීම් 266,800කට වැඩි ප්‍රමාණයක් සිදුකරනලදී. මෙම ක්‍රියාවලිය 2021 වර්ෂයේ සිට අඛණ්ඩව සිදුකරමින් පවතී. 2022 වර්ෂයේ හොඳම ජාලගත මෘදුකාංගය ලෙස MSDFAR පද්ධතිය සඳහා ජාලගත මෘදුකාංග භාවිතා කරන රාජ්‍ය ආයතන තේරීමේ තරගාවලියෙන් රන් පදක්කමක් ද, 2024 රාජ්‍ය සේවා හොඳම නවා නිෂ්පාදනය/ ව්‍යාපෘතිය තේරීමේ තරඟාවලියෙන් දෙවන ස්ථානය ද හිමි විය.

දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය.
www.fisheriesdept.gov.lk.




රූපය : නිල වෙබ් අඩවිය

දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ අංශය වගකීම දරයි. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය දිනපතා යාවත් කාලීන වන අතර දෙපාර්තමේන්තු ක්‍රියාදාමයන් පිළිබඳ විස්තර ඇතුළත් වේ. දෙපාර්තමේන්තුවේ සෑම අංශයකටම හා සෑම දිස්ත්‍රික් කාර්යාලයකටම තමන්ගේම පිටුවක් ඇති අතර එහි එම අංශය වගකිවයුතු ක්‍රියාකාරකම් ඇතුලත් කර තිබේ. නිලධාරීන්ගේ සම්බන්ධතා තොරතුරු වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර ඒවා නිරන්තරයෙන් යාවත්කාලීන වේ. වෙබ් අඩවියේ ඇති ප්‍රවේශය හරහා නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේම සියලුම පද්ධතියට ප්‍රවේශවිය හැකිය. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හොඳම සිංහල වෙබ් අඩවිය සඳහා රන් පදක්කම සහ 2020 හොඳම වෙබ් තරඟයේ හොඳම රජයේ වෙබ් අඩවිය සඳහා කුසලතා ත්‍යාගය දිනාගත්තේය.

**තාක්ෂණික ගැටළු තත්‍යකාලීනව විසඳීම සඳහා Inquiry Management System ක්‍රියාත්මක කිරීම.**

ප්‍රධාන කායීාලය , ධීවර දිස්ත්‍රික් කායීාල හා වරාය කායීාල වෙතින් තොරතුරු තාක්ෂණ අංශය වෙත පැමිණෙන තාක්ෂණික ගැටළු තත්‍යකාලීනව විසඳීම සඳහා inquiry Management System ක්‍රියාත්මක කිරීම. මෙම පද්ධතිය මඟින් දෛනිකව ලැබෙන ගැටළු තත්‍යකාලීනව විසඳනු ලබයි. මෙම ක්‍රමය මගින් තොරතුරු තාක්ෂණ අංශය වෙත යොමුවන ගැටළු විසඳා ගැනීමේ ප්‍රතිශතය 99% පමණ වේ.




රූපය : Inquiry Management System

යොමුවන ගැටළු වල විස්තරයක් පහත දැක්වේ.




රූපය : Inquiry Management System categories

**දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ජාලගත මෘදුකාංග භාවිතය පිළිබදව නිලධාරී පුහුණුව.**

ධීවර දිස්ත්‍රික්ක 15 හි මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කරන ආකාරය වෙන වෙනම නිරීක්ෂණය කරන අතර ඒ සඳහා අප අංශයේ නිලධාරීන් කැපවී සිටී. 2025 වසරේදී දිස්ත්‍රික්ක 15ම ආවරණය වන පරිදි ධීවර ලියාපදිංචිය සඳහා පුහුණුවක් අදාළ දිස්ත්‍රික්කය වෙත ගොස් අප තොරතුරු තාක්ෂණ අංශයේ නිලදාරීන් විසින් සිදු කරන ලදි. එසේම දිස්ත්‍රික් ධීවර නිලධාරීන්ට මාර්ගගත පද්ධතීන් පිලිබඳ පුහුණුවක් ප්‍රධාන කායීාලය්යෙහි පැවැත්වීමට සූදානම් කළද යටිතල පහසුකම් මදි වීම හේතුවෙන් දිස්ත්‍රික්ක 6ක නිලධාරීන්ට පමණක් එම පුහුණුව ලබා දෙන ලදි. 2026 වසරේදී ඉතිරි දිස්ත්‍රික්ක වල ධීවර නිලධාරීන්ට හා ප්‍රධාන කායීාලීය නිලධාරීන්ට එම පුහුණුව ලබා දීමට නියමිතය.









“Ditwah” සුළි කුනාටුව නිසා ධීවර ප්‍රජාව වෙත සිදු වූ ආපදාවන් ඇතුළත් කිරීම සඳහා මාර්ගගත disaster management system ක්‍රියාත්මක කිරීම.

Ditwah සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ ධීවර යාත්‍රා, යාත්‍රාංගන, ආම්පන්න , ප්‍රජා ශාලා හා ධීවර ප්‍රජාවගේ රැකියාව සම්බන්ධ උපකරණ හා ගොඩනැගිලි සම්බන්ධව රජය දැනුවත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය මඟින් Fisheries Disaster Management System ස්ථාපනය කරන ලදි.මෙම පද්ධතිය හරහා සියළුම ධීවර දිස්ත්‍රික්ක වල නිලධාරීන් විසින් තම දිස්ත්‍රික්කයට අදාළ දත්ත හා තොරතුරු ඇතුළත් කරයි.




රූපය : Disaster management system

නිලදාරීන්ට අතිකාල දීමනා ගෙවීම සඳහා මාර්ගගත පද්ධතියක් (Online Over Time management System) ආරම්භ කරන ලදි.

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ලංකාව පුරා ධීවර දිස්ත්‍රික් කාර්යාල 15ක් ප්‍රමුඛව වරාය කායාීල වල ද සේවය කරනු ලබයි. මෙම සියළුම නිලදාරීන් හට අතිකාල අදාළ මාසයන් තුළ දී නිවැරදිව හැකි ඉක්මනින් ලබා දීම සඳහා මුදල් අංශය හා සම්බන්ධ වී තොරතුරු තාක්ෂණ අංශය අතිකාල ගෙවීම සඳහා මාර්ගගත පද්ධතියක් හඳුන්වා දෙන ලදි. මේ පද්ධතිය මඟින් නිලධාරීන්ගේ අතිකාල පැය ගණන නිවැරදිව ගණනය කිරීමට හා අදාළ අතිකාල දීමනාව නිවැරදිව නිලදාරීන් හට ලබා දීමට හැකිවිය.




රූපය : Online Over Time management System

## KPI (Key Performance Indicator) System

තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන් හට තම තමන්ගේ වැඩ රාජකාරීන් අනුව එම රාජකාරියට අදාළ ඉලක්ක සපුරා ගැනීම උදෙසා නිලදාරීන්ගේ ප්‍රගතිය මැනීමට KPI (Key Performance Indicator) system එකක් අත්හදා බැලීමක් ලෙස ස්ථාපනය කරන ලදි. මේ අනුව එක් එක් නිලධාරීන්ට කාල රාමුවකට අනුව තම තමන්ගේ ඉලක්ක සපුරා ගැනීම සඳහා මාර්ගගත පිවිසුමක් (Online login) ලබා දී ඒ අනුව කටයුතු කිරීමට යොමු කරන ලදි. නිලධාරී හිඟතාව හේතුවෙන් අදාළ කාලරාමුව තුළ රාජකාරිය ඉටු කිරීමට පිලිබඳ අදහසක් මෙම නිලධාරීන්ට මෙම පද්ධතිය හරහා ලබා ගත හැක.




රූපය : KPI (Key Performance Indicator) System

## නිවාඩු කළමනාකරණ පද්ධතිය (Leave Management System)

පැය 24 පුරාවටම දිස්ත්‍රික් කාර්යාල හා වරාය කාර්යාල වලින් විවිධ පරිශීලකයින් ප්‍රවේශවන පද්ධතීන් කිහිපයක් තොරතුරු තාක්ෂණ අංශය හරහා ක්‍රියාත්මක වන බැවින් සීමිත නිලධාරීන් පිරිසක් මඟින් මෙම කටයුතු සිදු කිරීම අපහසු වීඇත. එමෙන් ම නිලධාරීන් නිවාඩු ඉල්ලීම් කිරීම නිසා ද රාජකාරීන් වලට අපහසුතා සිදු විය හැකි බැවින් එය අවම කිරීම සඳහා මාර්ගගතව නිවාඩු කළමනාකරණය කිරීම සඳහා පද්ධතියක් අත්හදාබැලීමක් ලෙස තොරතුරු තාක්ෂණ අංශය තුළ ස්ථාපනය කරන ලදි. මෙය ආයතන සංග්‍රහය අනුව නිලධාරීන් නිවාඩු ඉල්ලුම් කරන පොදු 125 ආකෘතිය අනුව සකසන ලද මාර්ගගත පද්ධතියකි




රූපය : Leave Management System

## Online Payment Portal

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවන විවිධ පාර්ශවකරුවන්ට විවිධ අවස්ථාවන් වලදී ගෙවීම් කටයුතු සිදු කිරීමට සිදුවේ. යාත්‍රා හිමිකරුවන් මෙන්ම විවිධ පුද්ගලික ආයතනවලට ද මෙසේ ගෙවීම් හා සම්බන්ධ වීමට සිදුවන බැවින් කාල කළමනාකරනය කර ඉක්මනින් ගෙවීම් කටයුතු සිදු කිරීමට තොරතුරු තාක්ෂණ අංශය හරහා Online Payment Portal ස්ථාපනය කරන ලදි. විවිධ බලපත්‍ර ගාස්තු, ලියාපදිංචි ගාස්තු හා වෙනත් ගෙවීම් කටයුතු පහසුවෙන්,ආරක්ෂිතව මාර්ගගත ක්‍රමයට කර ගැනීමේ හැකියාව මෙම පද්ධතිය හරහා පවතී.




රූපය : Online Payment Portal

**මත්ස්‍ය ඒකරාශී ඇටවුම Fish Aggregation Device (FAD)**




මත්ස්‍ය ඒකරාශී ඇටවුම් යනු ඉලක්ක කරගත් මසුන් වර්ග එකක් හෝ කිහිපයක් ආකර්ෂණය කර ගැනීම සඳහා මිනිසා විසින් නිර්මාණය කරන ලද පාවෙන වස්තු වේ. ඒවා බෝයාවන් ලෙස පාවෙන හෝ සාගර පතුලට සම්බන්ධ කර භාවිතා කරයි. මෙම ක්‍රමය ශ්‍රී ලංකා ධීවර ප්‍රජාවට තවමත් නවයක් වුවද, බටහිර රටවල් සහ ඉන්දුනීසියාව වැනි රටවල් තුළ ඉතා කාර්යක්ෂම ධීවර විධි ක්‍රමයක් ලෙස භාවිතා කරමින් හැඹිලි දැල් හෝ අත් යොත් ක්‍රමයෙන් මසුන් අල්ලා ගනී.

ඉදිරියේදී මත්ස්‍ය ඒකරාශී ඇටවුම් කළමනාකරණය සඳහා පංගු (Quota) ක්‍රමයක් හඳුන්වාදීමට නියමිත බැවින්, ශ්‍රී ලංකාවට එහි කොටස්කරුවෙකු වීමට මෙය වැදගත් වේ. වර්තමානයේ පවතින හැඹිලි දැල් සම්බන්ධ ගැටලු සඳහාද මෙම ක්‍රමය ප්‍රධාන විසඳුමක් විය හැක. මත්ස්‍ය ඒකරාශී ඇටවුම් ආශ්‍රිත කළමනාකරණ ප්‍රදේශ හඳුන්වාදී නීතිගත කිරීමෙන් පරිසර හිතකාමී අත් යොත් පන්නය ප්‍රචලිත කිරීමටද හැකි වේ. එබැවින්, මාලදිවයින් ආදර්ශයට ගනිමින් ජාත්‍යන්තරව පිළිගත් මත්ස්‍ය ඒකරාශී ඇටවුම් ක්‍රමයක් ශ්‍රී ලංකාව තුළ හඳුන්වාදීම අනාගතය උදෙසා කාලෝචිත හා ප්‍රතිපත්තිමය වැදගත් තීරණයක් වේ.

මත්ස්‍ය ඒකරාශි කර පිහිටුවීමේ වැඩපිළිවෙල යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස මේ වන විට මීගමුව, ත්‍රිකුණාමලය, දෙහිවල සහ කොග්ගල යන ප්‍රදේශවල නොගැඹුරු මුහුදේ ඇටවුම් 05ක් පිහිටවූ අතර මේ සඳහා වන වියදම රු.මි. 25 ඉක්මවා ගොස් ඇත. කොග්ගල ප්‍රදේශයේ පිහිටවූ ඇටවුම පිහිටි ස්ථානයෙන් ගැලවී ගිය අතර අනෙකුත් ඇටවුම් සාර්ථකව ක්‍රියාත්මක වේ.

## කළමණාකරන අංශය

### ධීවර හා ජලජ සම්පත් තිරසාර ලෙස කලමණාකරණය

ධීවර කළමනාකරණය යනු ධීවර හා සාගර සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සහ සංරක්ෂණය කිරීම අරමුණු කරගත් බහුවිධ ප්‍රවේශයකි. 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත අනුව සකස් කරන ලද ශක්තිමත් නියාමන රාමු සහ ප්‍රතිපත්ති මගින් පාලනය වන අතර, එයට බලපත්‍ර, නියාමනය සහ බලාත්මක කිරීම , අධීක්ෂණය කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ අංශය මඟින් සිදු කරයි. තීරණ ගැනීමේ ක්‍රියාවලින්හි දේශීය මැදිහත්වීම් සහතික කරමින් ප්‍රජා පාදක කළමනාකරණය මුල පිරීම් හරහා ප්‍රජා සහභාගීත්වය දිරිමත් කරනු ලැබේ. සමස්ථයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ධීවර කළමනාකරණය වර්තමාන සහ අනාගත පරම්පරාවේ ප්‍රයෝජනය සඳහා පාරිසරික සංරක්ෂණය සමඟ සමාජ-ආර්ථික අවශ්‍යතා සමතුලිත කිරීමට උත්සාහ කරයි. මෙම දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ අංශය ඉහත ක්‍රියාකාරකම් සිදුකිරීමේ වගකීම දරන අතර එම අංශයේ ප්‍රධාන කාර්යයන් පිලිබඳ විස්තර පහත දැක්වේ.

**අරමුණ**

මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ ධීවර යෙදවුම් සහ මෙහෙයුම් නියාමනය මලින් ධිවර හා සාගර සම්පත් කළඹණාකරණය කිරිමත් ප්‍රජා සහභාගීත්වයෙන් මුහුදු, කලපු සහ ජලාශවල ධීවර සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය මගින් ශ්‍රී ලංකාවේ ධිවර ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් අත්කර ගැනීමයි.

**කාර්යයන්**

- ධීවර රෙගුලාසි සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම.
- ධිවර යාත්‍රා පැවරීම (බහුදින ධිවර යාත්‍රා)
- ධිවර යාත්‍රා උකස් කිරීම හා ධිවර යාත්‍රා උකස් නිරවුල් කිරීම.
- ධිවර යාත්‍රා ලියාපදිංචිය අවලංගු කිරීම.
- ජාත්‍යන්තර මුහුදේ ධිවර මෙහෙයුම් සඳහා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- දේශිය මුහුදේ ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශීය යාත්‍රා සඳහා මාළු ගොඩබෑමේ බලපත්‍ර නිකුත් කිරීම.
- විසිතුරු මසුන් සඳහා ආනයන, අපනයන සහ ප්‍රතිඅපනයන බලපත්‍ර නිකුත් කිරීම.
- මුහුදු කුඩැල්ලන් හා පොකිරිස්සන් ඇල්ලීම, සන්තකයේ තබාගැනීම, ප්‍රවාහනය සහ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- හක්බෙල්ලන්, සිප්පිකටු සහ මෝරවරල්, නක්ලා, බෙල්ලන්ගේ මාංශ (Chicories Ramous) මුහුදු තෘණ සඳහා ප්‍රවාහනය සහ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- පොකිරිස්සන් සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම.
- කෘතිම උපස්තර මත වගා කරන ලද කොරල් අපනයනය සඳහා බලපත්‍ර ලබා දීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- ධිවර යාත්‍රා නියමුවන් සඳහා නියමු බලපත්‍ර නිකුත් කිරීම.

- මා දැල් වරායන් සහ හිමිකරුවන් ලියාපදිංචි කිරීම සහ වෙරළ තීරයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ගැටලු නිරාකරණය.
- මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා ලියාපදිංචි කිරීම හා කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම.
- මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා ලියාපදිංචි කිරීම හා කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම.
- මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ප්‍රතිඅපනයනය සඳහා ලියාපදිංචි කිරීම හා කළමනාකරණ බලපත්‍ර නිකුත් කිරීම.
- නව යාත්‍රා ලියාපදිංචි කිරීමේ අංක වෙන් කිරීම, අනුමත කිරීම, නිකුත් කිරීම.
- විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක ධීවර කළමනාකරණය සම්බන්ධ සියළුම ව්‍යාපෘති කටයුතු.
- ජාත්‍යන්තර මුහුදේ ක්‍රියාත්මක වන යාත්‍රා ලැයිස්තුව සකස් කිරීම, නඩත්තු කිරීම හා අදාළ ආයතන වෙත වාර්තා කිරීම.
- විදේශ රටවල ධීවර රැකියාවේ යෙදීමට දේශිය ධීවරයන්ට අනුමැතිය ලබා දීම.
- විදේශ රටවලට දේශීය නිෂ්පාදිත යාත්‍රා අලෙවිය, පැවරීම කිරීමේදි අනුමැතිය ලබා දීම.
- විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම ඒ සම්බන්ධයෙන් අදාළ රෙගුලාසි සකස් කිරීම හා කළමනාකරණ සැපසුම් ක්‍රියාත්මක කිරීම.
- ඉලක්කගත මත්ස්‍ය විශේෂ සම්බන්ධයෙන් තොග සමීක්ෂණය අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව කළමනාකරණ ක්‍රමවේද හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම.
- නීති විරෝධී ධීවර කර්මාන්තය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- මෝර මත්ස්‍ය කළමනාකරණය සම්බන්ධ කටයුතු අධීක්ෂණය කිරීම සහ ජාතික ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාත්මක කිරීම
- විනෝදාත්මක කටයුතු සඳහා මසුන් ඇල්ලීම පිළිබඳ බලපත්‍ර නිකුත් කිරීම (Recreational fishing activity).
- අපනයන මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන රේගු නිෂ්කාශන සඳහා ASYCUDA පද්ධතිය හරහා අනුමැතිය ලබා දීම.

ධීවර හා ජලජ සම්පත් තිරසාර ලෙස කලමණාකරණය කිරීම හා විධිමත් කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයක් වන අතර, ඒ සඳහා ධීවර යාත්‍රා, ධීවර මෙහෙයුම් වෙනුවෙන් කලමණාකරන බලපත්‍ර නිකුත් කිරීම්, නීත්‍යනුකූල නොවන, අවිධිමත්, වාර්තා නොවන ධීවර කටයුතු වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම් සිදු කරන අතර 2025 වර්ෂයට අදාලව 2025.08.31 දින දක්වා පහත සඳහන් පරිදි විවිධ ධීවර මෙහෙයුම් හා යාත්‍රා සඳහා බලපත්‍ර ලබා දී ඇත.

2025.12.31 දිනට අදාලව එක් එක් කාර්යන්හි ප්‍රගතිය

| අනු අංකය | ක්‍රියාකාරකම | අපේක්ෂිත ඉලක්කය | 2025.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | ධීවර යාත්‍රා ලියාපදිංචිය (නව) | 2,000 | 2895 |
| 2 | මහ මුහුදේ යාත්‍රා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරිම | 1,020 | 1443 |
| 3 | යාත්‍රා නියමු බලපත්‍ර නිකුත් කිරිම. | 500 | 169 |
| 4 | විසිතුරු මසුන් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරිම | 25 | 49 |
| 5 | විසිතුරු මසුන් අපයනය සඳහා බලපත්‍ර නිකුත් කිරිම | 30 | 42 |
| 6 | විසිතුරු මසුන් ප්‍රතිඅපයනය සඳහා බලපත්‍ර නිකුත් කිරිම | 15 | 15 |
| 7 | කටු පොකිරිස්සන් අපනයනය සඳහා බලපත්‍රලබාදීම | 80 | 56 |
| 8 | කටු පොකිරිස්සන් ළඟතබා ගැනීම,ප්‍රවාහනය | 10 | 19 |
| 9 | හක්බෙල්ලන් ළඟ තබා ගැනීම, ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදිම | 80 | 58 |
| 10 | හක්බෙල්ලන් අපනයනය සඳහා බලපත්‍ර ලබාදිම | 40 | 24 |
| 11 | මුහුදු කුඩැල්ලන් ඇල්ලීම, එකතු කිරිම, ළඟ තබා ගැනීම හා ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීම | 200 | 185 |
| 12 | මුහුදු කුඩැල්ලන් ආනයනය, අපනයනය, ප්‍රති අපනයනය සඳහා බලපත්‍රලබාදීම | 150 | 134 |
| 13 | සිප්පි කටු එකතු කිරීම ප්‍රවාහනය සහ විසිතුරු භාණ්ඩ නිෂ්පාදනයසඳහා බලපත්‍ර නිකුත් කිරීම | 20 | 35 |
| 15 | මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා ලියාපදිංචි කිරිම | 200 | 168 |
| 16 | මසුන් හා මත්ස්‍ය නිෂ්පාදනඅපනයනය සඳහා ලියාපදිංචි කිරීම | 150 | 208 |
| 17 | මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන ප්‍රතිඅපනයනය සඳහා ලියාපදිංචිකිරීම | 13 | 15 |
| 18 | නව යාත්‍රා සඳහා ලියාපදිංචි අංක වෙන්කිරිම, අනුමතකිරිම සහ නිකුත් කිරිම | IMUL-100 | 66 |
| | | OFRP-1000 | 1704 |
| | | MTRB-250 | 191 |
| | | NTRB-500 | 1256 |
| 19 | නක්ලා (Operculum of ***Chicoreusramosus***) අපනයනය කිරීම සඳහා බලපත්‍රය | 15 | 11 |
| 20 | නක්ලා (Operculum of ***Chicoreusramosu***s) සන්තකයේ තබාගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | 15 | 15 |
| 21 | ***Chicoreusramosus*** මාංශ සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනයකිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | 30 | 22 |
| 22 | ***Chicoreusramosus*** මාංශ අපනයන බලපත්‍රය | 15 | 15 |
| 23 | අජීවී මුහුදු බෙල්ලන්ගේ කවච ප්‍රවාහනය කිරීම, සන්තකයේ තබා ගැනීම සහප්‍රදර්ශනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | 20 | 32 |
| 24 | මුහුදුතෘණ, ප්‍රවාහනය කිරීම සහ අපනයනය කිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම. | 8 | 20 |
| 25 | ලොග් පොත් නිකුත් කිරීම | 1,000 | 1400 |

**ජාතික ධීවර යාත්‍රා සංගණනය**

ධීවර යාත්‍රා තොරතුරු නිවැරදි ලෙස වාර්තා කිරිමේ අවශ්‍යතාව මත සැලසුම් කරන ලද ජාතික ධීවර සංගණනය අදියර කිහිපයක් යටතේ ශ්‍රී ලංකාවේ සියලුම ධීවර යාත්‍රා සඳහා සිදු කරන අතර මෙහි පළමු අදියර ලෙස පිටත එංජිම සහිත OFRP සහ MTRB යාත්‍රා සංගණනය අගෝස්තු මස 4 දින සිට දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදි. මේ වන විට දිවයින වටා පිහිටි 900කට අදිකවු ධීවර යාත්‍රා තොටුපළ වල ඇති සියලුම පිටත එංජිම සහිත OFRP සහ MTRB යාත්‍රා සංගණනය සංගණනය සිදු කර අවසන් කර සංසණන වාර්තාව ලබා දි ඇත.

| දිස්ත්‍රික්කය | MTRB | OFRP | එකතුව |
|---|---|---|---|
| මඩකලපුව | 16 | 2364 | 2380 |
| හලාවත | 72 | 1 860 | 1 932 |
| කොළඹ | 1 | 601 | 602 |
| ගාල්ල | 360 | 903 | 1 263 |
| යාපනය | 1 141 | 6 412 | 7 553 |
| කල්මුණේ | 199 | 1 152 | 1 351 |
| කළුතර | 2 | 757 | 759 |
| කිළිනොච්චි | 186 | 1 248 | 1 434 |
| මන්නාරම | 756 | 3 074 | 3 830 |
| මාතර | 444 | 1 112 | 1 556 |
| මුලතිව් | 1 | 2 152 | 2 153 |
| මීගමුව | 18 | 2 039 | 2 057 |
| පුත්තලම | 329 | 3 679 | 4 008 |
| තංගල්ල | 253 | 1 147 | 1 400 |
| ත්‍රිකුණාමලය | 184 | 4 459 | 4 643 |
| එකතුව | **3 962** | **32 959** | **36 921** |











**ධීවර යෙදවුම් හා ආම්පන්න පිළිබඳ පුහුණුව**





ධීවර යාත්‍රා සංගණනයට සමගාමීව සියලුම ධීවර ක්ෂේත්‍ර නිළධාරින් සඳහා ධිවර ආම්පන්න හා ධීවර යෙදවුම් පීළිබඳ පුහුණු වැඩසටහන් තුනක් කලාවැව පුහුණු මධ්‍යස්ථානයේදි ලබා දෙන ලදි.

## මෙහෙයුම් අංශය

### ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ හුවමාරුව සඳහා සන්නිවේදන පහසුකම් ලබාදීම

ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවුඩ හුවමාරු සන්නිවේදන පහසුකම් ලබාදීමේ කටයුතු ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන හරහා කොළඹ ප්‍රධාන මෙහෙයුම් මැදිරිය විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ. සන්නිවේදන පහසුකම් වැඩි දියුණු කරමින් ගොඩබිම හා ධීවර යාත්‍රා අතර සම්බන්ධතාවක් පැය 24 පුරා තබා ගැනීමට කටයුතු කර ඇත. මෙමගින් ධීවර යාත්‍රා සඳහා කාලගුණ වාර්තා සහ හදිසි අයහපත් කාලගුණ තත්ත්ව පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් දෛනිකව ලබාදෙන අතර යාත්‍රා හිමියන් විසින් මුහුදේ ඇති තම යාත්‍රාව සමග සිදුකරනු ලබන අත්‍යවශ්‍ය පණිවුඩ හුවමාරු කටයුතු සිදු කිරීම සඳහා පහසුකම් සපයනු ලබයි. ධීවර යාත්‍රාවලින් හදිසි පණිවුඩ ලැබුණු අවස්ථාවේ සිට සහන/මුදාගැනීම් කටයුතු සිදුකරන අවස්ථාව දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ කලාපීය සමුද්‍රීය බේරාගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සමග අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබයි. මෙම කාර්යයන් සඳහා කොළඹ ප්‍රධාන කාර්යාලය සමග ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන 19 කටයුතු කරනු ලබයි.

මෑතකදී ආරම්භ කරන ලද මයිලඩි, දික්ඕවිට, වෙල්ලමන්කරය, කලමැටිය සහ කප්පරතොට යන ධීවර වරායන් වල ප්‍රාදේශීය ගුවන් විදුලි මධ්‍යස්ථාන ආරම්භ කිරීමට යෝජිතව ඇත. ධීවර දෙපාර්තමේන්තුව සතුව පවතින පැරණි ගුවන් විදුලි යන්ත්‍ර උපයෝගී කරගෙන දැනට සෝදිසි මෙහෙයුම් කටයුතු සාමාන්‍ය පරිදි සිදු කරනු ලබන අතර ඉහත ධීවර වරායන් සඳහා නව ගුවන් විදුලි යන්ත්‍ර වල අවශ්‍යතාවය දැඩි ලෙස ඇති වී ඇත.

### ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර ලබාදීමට හා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කිරීම.

අන්තර්ජාතික නීති රීතිවලට අනුකූලවීම සඳහා මහ මුහුදේ ධීවර කටයුතුවල නිරත ධීවර යාත්‍රා සඳහා අන්තර්ජාතික ඇමතුම් සංඥා ලබාදීම ධීවර දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව සිදුකරනු ලබයි. ධීවර යාත්‍රා හිමියන්ගේ අයදුම්පත් ලබාගෙන විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා එක්ව කටයුතුකරමින් ධීවර යාත්‍රාවල ගුවන් විදුලි පණිවිඩ හුවමාරුකිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම කඩිනම් කිරීම සඳහා සෝදිසි මෙහෙයුම් අංශය මැදිහත්වී කටයුතුකරනු ලබයි.

**ඉල්ලුම්පත් ප්‍රමාණය**

| | |
|---|---|
| ලබා දෙන ලද ගුවන් විදුලි පණිවුඩ හුවමාරු යන්ත්‍ර බලපත්‍ර සඳහා ඉල්ලුම්පත් ප්‍රමාණය | 551 |

**ධීවර යාත්‍රා හා ධීවර කාර්මිකයින්ට වන අනතුරු වලදී රක්ෂණ ආවරණ ලබාගැනීමට අවශ්‍ය තොරතුරු සනාථ කර දීම.**

ධීවර යාත්‍රාවලට හා ධීවර කාර්මිකයින්ට වන අනතුරුවලදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී හා ඔවුන් විසින් රක්ෂණ වන්දි ලබාගැනීමේදීද රක්ෂණ ආයතන වලට ධීවර යාත්‍රාවන් විසින් ලබාදෙන සියලු පණිවිඩ හුවමාරු තොරතුරු අදාල ප්‍රාදේශීය කාර්යාල වලින් හා ප්‍රධාන කාර්යාලයෙන් ලබාගන්නා සටහන් ද භාවිතා කොට සහතික කර ඉදිරිපත් කරනු ලබයි.

මෙම දෙපාර්තමේන්තුව සතුව ආපදාවට ලක්වන ධීවර යාත්‍රා හා ධීවර කාර්මිකයන් බේරා ගැනිම, හදිසි ප්‍රතිකාර ලබා දිමට හා කඩිනමින් ගොඩබිමට රැගෙන ඒමට මුදාගැනීමේ යාත්‍රා නොමැති බැවින් නාවික හමුදාවේ සහ වෙරල ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහය ලබා ගනු ලබයි.

අනතුරු සංඛ්‍යාව

| | |
|---|---|
| **මහමුහුදේ වාර්තා වූ කාර්මික දෝෂ /යාත්‍රා අනතුරට පත්වීම්** | 233 |
| **මහ මුහුදේ සිදු වූ පුද්ගල මරණ සහ අතුරුදහන් වීම්** | 19 |
| **හදිසි අනතුරු නිසා විනාශයට පත් ධීවර යාත්‍රා සංඛ්‍යාව** | 05 |

**විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම**

| රට | අත්අඩංගුවට පත් ධීවරයින් සංඛ්‍යාව | අත්අඩංගුවට පත් යාත්‍රා සංඛ්‍යාව | මුදාගත් ධීවරයින් සංඛ්‍යාව | මුදාගත් යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **ඉන්දියාව** | 12 | 05 | 06 | - |
| **මාලදිවයින** | 65 | 10 | 65 | 07 |
| **සීසේල්ෂ්** | 17 | 03 | 17 | - |
| **මියන්මාර්** | - | - | - | - |
| **මැඩගස්කර්** | 07 | 01 | 07 | - |

මෙම නිදහස් කර ගැනීම් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය මගින් ඉන්දියාව, මාලදිවයින, ප්‍රංශය මෙන්ම ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාල වල සහය ලබා ගනු ලබයි.

**දේශීය, ජාත්‍යන්තර හා විදේශ රටවලට අයත් මුහුදු සීමාවන්හී පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම.**

| මුදාගත් ධීවරයින් සංඛ්‍යාව | මුදාගත් යාත්‍රා සංඛ්‍යාව | අත්හැර දමන ලද යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|
| **1248** | 228 | 05 |

එන්ජින් අක්‍රියවීම නිසා ආසන්න රටවල් වල මුහුදු සීමාවන්ට පාවී යන ලද, මුහුදේදී හදිසි අනතුරු වලට ලක් වන ලද, ධීවර යාත්‍රා හා හදිසි අසනීප තත්වයන්ට පත් වූ ධීවර කාර්මිකයින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ/වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ යාත්‍රා, වෙළඳ නැව් හා ධීවර යාත්‍රා මගින්ම බේරා ගැනීම් කටයුතු සිදු කරන ලද අතර වෛද්‍ය ප්‍රතිකාර සඳහා කඩිනමින් රෝහල් ගත කරන ලදි.

**කුඩා / එක්දින යාත්‍රා සඳහා සන්නිවේදන පහසුකම් ලබාදීම**

වෙරළාසන්න ධීවර රැකියාවේ යෙදෙන කුඩා යාත්‍රා හා ධීවර පිරිස් වෙත සඳහා හදිසි කාළගුණික වෙනස්වීම් පූර්ව කාළගුණික අනතුරු ඇගවීම් ඉක්මණින් ධීවර ප්‍රජාව වෙත ලබා දී ජීවිත හානි වළක්වා ගැනිමේ අරමුණින් යුතුව ඩයලොග් ආයතනය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා මෙම දෙපාර්තමෙන්තුව ගිවිසුම් ගත විය. ඒ අනුව 2025 වර්ෂයේ මේ වන විට ධීවර කාර්මිකයින් සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් 120,000ක් පමණ මෙම ඩයලොග් තොරතුරු සේවාවේ ලියාපදිංචි වී ඇති අතර ඔවුන් මෙහි ප්‍රතිලාභ භුක්ති විඳිමින් සිටි.

**ධීවර ප්‍රජාව දැනුවත් කිරිම**

ධීවර ප්‍රජාව/ ධීවර කාර්මිකයින් හා යාත්‍රා අයිතිකරුවන් දැනුවත් කිරීම් සිදු කිරිම අත්‍යාවශ්‍ය කරුණක් වුවද ධීවර කාර්මිකයින්ගේ ජීවිත ආරක්ෂාව සඳහා වන උපදෙස් හා හදිසි අනතුරකදි අනුගමනය කල යුතු ආකාරය මෙන්ම ගොඩබිම හා සම්බන්ධ වි හදිසි උපකාර සේවා ලබා ගන්නා ආකාරයද හදිසි කාලගුණ විපර්යාසයන්ට අනුව ඇතිවන සුළි කුණාටු වලදි ජීවිත ආරක්ෂා කිරිමට අනුගමනය කරන ක්‍රමවේදයන් හා ගුවන් විදුලි යන්ත්‍ර සඳහා බලපත් ලබා ගන්නා ආකාරය පිලිබඳව දැනුවත් කිරීම් සිදුකිරිමට අත්‍යාවශ්‍ය බව පෙනී ගියද මෙරට තුල පවතින ආර්ථික අර්බුද තත්වය මත නිසියාකාරව ඉටුකර ගැනිමට නොහැකිවිය.

යාත්‍රාවල යෙදෙනන්ගේ මත් ද්‍රව්‍ය භාවිතාව ඉහල යාම හා එමගින් ඇති වූ අහිතකර ප්‍රවණතාවක් ලෙස නැව් මාර්ගයේ අනතුරු සිදුවීම් ඉහල ගොස් ඇති අතර ජිවිත හානි/යාත්‍රා විනාශවීම් වැඩි වි ඇත. එමෙන්ම සංවිධානාත්මක අනවසර සංක්‍රමණ සඳහා යාත්‍රා යොදා ගැනිම බහුල වී ඇත. යාත්‍රා විශාල ප්‍රමාණයක් මහමුහුදේදි යාන්ත්‍රික දෝෂ සහිත විම ඉහල ගොස් ඇති අතර විශේෂයෙන්ම වෙනත් රටවල මුහුදු සිමා ආසන්නයේ සිදු වන ආපදා තත්වයන් වැඩි වී ඇති බැවින් වෙනත් රටවල් සමගින් නිරන්තරයෙන් රාජතාන්ත්‍රික මැදිහත්වීම් මගින් ඒ ඒ රටවල බේරා ගැනිමේ මධ්‍යස්ථාන වෙත දන්වා යැවිමට සිදුවී ඇත. එබැවින් යාත්‍රා හිමියන් යාත්‍රා පිටත් කර යැවිමට ප්‍රථම නැවතත් තම යාත්‍රා නාවික ගමන් සඳහා යෝග්‍ය තත්ත්වයක පවතිද යන්න පරීක්ෂා කිරිම සඳහා උනන්දු කරවිමට දැනුවත් කිරීම් කළ යුතුය.

**එක් එක් වරායෙන් පිටත් වූ ධීවර යාත්‍රා සඳහා ලබා දුන් පිටත්වීම් ගණන**

| | වරාය | පිටත්වීම් ගණන | | | වරාය | පිටත්වීම් ගණන |
|---|---|---|---|---|---|---|
| 1 | කල්පිටිය | 489 | | 14 | තංගල්ල | 1816 |
| 2 | මීගමුව | 5809 | | 15 | හම්බන්තොට | 1240 |
| 3 | දික්ඕවිට | 1215 | | 16 | කිරින්ද | 572 |
| 4 | බේරුවල | 6188 | | 17 | වාලච්චේන | 18179 |
| 5 | අම්බලන්ගොඩ | 1260 | | 18 | ත්‍රිකුණාමලය | 2981 |
| 6 | හික්කඩුව | 995 | | 19 | පොයින්ට්පේද්‍රු | 287 |
| 7 | ගාල්ල | 7343 | | 20 | මයිලඩි | 244 |
| 8 | මිරිස්ස | 3372 | | 21 | වෙල්ලමන්කරය | 1096 |
| 9 | දෙවිනුවර | 4692 | | 22 | කප්පරතොට | 646 |
| 10 | කෝට්ටෙගොඩ | 1335 | | 23 | ගන්දර | 2996 |
| 11 | නිල්වැල්ල | 2767 | | 24 | කලමැටිය | 543 |
| 12 | කුඩාවැල්ල | 6015 | | 25 | හලාවත | 341 |
| 13 | සයින්දමර්දු | 1557 | | | | |

**වාර්තා සහ යාත්‍රා ඡායාරූප දත්ත ගබඩාවට ඇතුලත් කිරිම හා කළමනාකරණය**

**ලොග් වාර්තා සහ යාත්‍රා ඡායාරූප දත්ත ගබඩාවට ඇතුලත් කිරිම හා කළමනාකරණය**

| | | |
|---|---|---|
| 1. | ධීවර මෙහෙයුම් වලට අදාලව ඒකකය වෙත ලැබුණු ලොග් පිටපත් ගණන | 5436 |
| 2. | මෙහෙයුම් වලට අදාලව නිකුත් කරන ලද සත්‍යාපන වාර්තා ගණන | 5436 |
| 3. | ලොග් දත්ත පද්ධතිය වෙත ඇතුළු කරන ලද ලොග් පිටපත් ගණන | 32656 |
| 4 | IOTC අවශ්‍යතා සඳහා පවත්වා ගන්නා යාත්‍රා ඡායාරූප දත්ත පද්ධතිය වෙත ඇතුලත් කරන ලද වාර්තා ගණන | 143 |

2015 වරාය රාජ්‍ය පියවරයයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව ශ්‍රී ලංකාවේ වරාය පහසුකම් ලබාගැනීමට මසුන් ගොඩබෑමට හෝ ප්‍රතිනැව්ගත කිරීමට පැමිණෙන විදේශීය ධීවර යාත්‍රා සඳහා බලපත්‍ර නිකුත් තිරීම් හා යාත්‍රා පරීක්ෂාවන් සිදු කරනු ලබයි. ඉන්දියානු සාගර ටූනා කොමිසමේ 16/11 සම්මුතියට අනුව ශ්‍රී ලංකාවේ වරායවලට පිවිසෙන විදේශීය ධීවර යාත්‍රා වලින් අවමය 5% කට අදාලව සිදු කරනු ලබන පරීක්ෂණ වාර්තා ඉන්දියානු සාගර ටූනා කොමිසම වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.

**සේවාවන්**

| සේවාවන් | නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | පරීක්ෂාවන් සංඛ්‍යාව |
|---|---|---|
| **මසුන් ප්‍රති නැව් ගත කිරීම** | 11 | 07 |
| **මසුන් ගොඩබෑම** | 02 | 01 |
| **නඩත්තු කටයුතු හා සැපයුම් සේවා** | 14 | 01 |
| **ආරක්ෂ නිලධාරීන් හා විදේශී ධීවර කාර්මිකයින් හුවමාරු කටයුතු සේවා** | 08 | 01 |
| **එකතුව** | **35** | **10** |

ඉන්දියානු සාගර ටූනා කොමිසමේ 11/04 සම්මුතියට අනුව මහ මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර යාත්‍රා වලින් අවමය 5% ක් වන පරිදි විද්‍යාත්මක ධීවර යාත්‍රා නිරීක්ෂකයින් යොදවා තොරතුරු ඉන්දියානු සාගර ටූනා කොමිසම වෙත ඉදිරිපත් කළයුතුව ඇත.

මීටර 24 ට වඩා වැඩි දිගින් යුතු යාත්‍රා සඳහා යෙදවූ නිරීක්ෂකයින් සංඛ්‍යාවත්, එම යාත්‍රා සිදුකල මෙහෙයුම් සංඛ්‍යාවත් පහත වගුවේ පරිදි වේ.

**ධීවර යාත්‍රා**

| මුළු ධීවර යාත්‍රා සංඛ්‍යාව > 24m | සක්‍රිය යාත්‍රා සංඛ්‍යාව | මුළු ධීවර මෙහෙයුම් ගණන | විද්‍යාත්මක ධීවර යාත්‍රා නිරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|
| **04** | 04 | 07 | 01 |

**ඉන්දියනු සාගර ටූනා කොමිසම ( IOTC ), ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), යුරෝපා සංගමය (EU) වැනි ජාත්‍යන්තර ආයතන හා සඳහා කාලීන වාර්තා සැපයීම සහ වාර්ෂික රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.**

- ඉන්දියනු සාගර ටූනා කොමිසම සඳහා වාර්ෂිකව සැපයිය යුතු වාර්තා අදාල දින වකවානු වලට යටත්ව සපයනු ලබයි.
- ඉන්දියානු සාගර ටූනා කොමිසමෙහි 10/11 සම්මුතියට අනුව සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවලට කම්ටු රැස්වීම් සහ සැසිවාර වලට සහභාගීවීම සඳහා ලබාදෙන අරමුදල් යටතේ අදාල තාක්ෂණික නිලධාරීන් වාර්ෂික රැස්වීම සඳහා සහභාගී වන ලදී.
- ඒ අනුව ශ්‍රී ලංකාව 2010 වසරේ සිට පහත පරිදි අනුකූලතා ප්‍රගතිය පෙන්නුම් කර ඇත.

**අනුකූලතා ප්‍රගතිය**

| 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5% | 18% | 47% | 51% | 60% | 74% | 77% | 82% | 87% | 90% | 86% | 76% | 83% | 73.8% | 71.2% |









විදේශීය ධීවර යාත්‍රා පරීක්ෂා කිරීම් කටයුතු සිදු කිරීම

**බහුදින ධීවර යාත්‍රා සඳහා ධීවර යාත්‍රා නිරීක්ෂණ උපකරණ 4200ක් (VMS) සවි කිරීම**

මේ වන විට අවසාන අදියරට අදාල VMS උපකරණ 82ක් සවිකරමින් පවතියි.

තවද, VMS උපකරණ හරහා බෝට්ටු හිමිකරුවන්ට ලාභදායී සහ කාර්යක්ෂම සේවා සැපයීමේ හැකියාව ඇත. මෙහිදී යාත්‍රාවේ සවි කර ඇති ඇන්ටනාව ඉතා අඩු බල අවශ්‍යතාවයකින් (2W) ක්‍රියා කරන අතර ප්‍රධාන බල සැපයුම නොමැති විට දින 3ක් දක්වා එහි උපස්ථ බලය භාවිතා කිරීමට හැකියාව ඇත. FMC කාර්ය මණ්ඩලයට පහසු සහ සුමට ලෙස මෙහෙයුම් සිදු කිරීමට එමගින් ඉඩ සැලසෙන අතර බෝට්ටුව වෙනත් රටවල EEZ කලාපය වැනි පාලිත ප්‍රදේශ අසල ඇති විට ස්වයංක්‍රීය අනතුරු ඇඟවීම් නිර්මාණය කරයි.

VMS පද්ධතියට අදාළ සියලුම වරාය කාර්යාල හරහා ප්‍රවේශ විය හැකි අතර DFAR හි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටා ඇති ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) මගින් මධ්‍යගතව කළමනාකරණය කරයි. දැනට

ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) මගින් යාත්‍රා 24x7 නිරීක්ෂණය කරයි. විදේශ රටවලට ඇතුළු වීම, VMS හානි කිරීම වැනි සැක කටයුතු හැසිරීම් හඳුනා ගැනීම FMC හි ප්‍රධාන රාජකාරිවලින් එකකි. FMC දිනපතා සංඥා නොමැති හෝ අඩු සංඥා සහිත යාත්‍රා (නිහඬ යාත්‍රා ලෙස හැඳින්වේ) හඳුනාගෙන ඔවුන්ගේ යාත්‍රාව නැවත අදාල ක්‍රමවේදයට ඇතුලත් වන තුරු යාත්‍රා පිටත්වීම අවලංගු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

දීර්ඝ කාලසීමාවක් සහිත VMS අක්‍රිය යාත්‍රා ඇතුළු සියලු සැක කටයුතු යාත්‍රා පිළිබඳ තොරතුරු පරීක්ෂණ පැවැත්වීම සඳහා විමර්ශන අංශය වෙත යොමු කරනු ලැබේ. මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ දේශසීමා තරණය වැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් සඳහා යොදා ගත හැකි අවදානම් යාත්‍රා හඳුනාගැනීම සඳහා අඛණ්ඩව කටයුතු කරයි.

ඔස්ට්‍රේලියාව-ශ්‍රී ලංකා VMS ව්‍යාපෘතිය යටතේ FMC සියලු නවීන තාක්ෂණයෙන් ද නවීකරණය කර ඇති අතර ඒ අනුව ශ්‍රී ලංකා FMC ආසියාවේ අති නවීන අධීක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත.

### තත්ත්ව පාලන අංශය

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සහ පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාව සිය මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා දැඩි තත්ත්ව පාලන ක්‍රියාමාර්ගවලට ප්‍රමුඛත්වය ලබා දී ඇත. මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන අපනයන රෙගුලාසි යටතේ ඇති විධිවිධාන මගින් පාලනය වන මෙම ක්‍රියාවලිය සහතික කිරීම, පරීක්ෂා කිරීම, සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක පිළිවෙත් පිළිපැදීම ඇතුළත් වේ. පසු විපරම් කිරීමේ පද්ධති (Traceability) සහ රසායනාගාර පරීක්ෂණ තත්ත්ව සහතිකය තවදුරටත් ඉහළ නංවන අතර ධාරිතා ගොඩනැගීම මගින් කර්මාන්ත සේවකයින්ගේ කුසලතා වැඩි දියුණු ආදිය සිදු කරයි. වෙළඳපල ප්‍රවේශ අවශ්‍යතා සපුරාලීමෙන් සහ නිෂ්පාදන අඛණ්ඩතාව පවත්වා ගැනීමෙන්, ගෝලීය වෙළඳපොලේ උසස් තත්ත්වයේ මුහුදු ආහාරවල විශ්වාසදායක මූලාශ්‍රයක් ලෙස ශ්‍රී ලංකාව සිය කීර්ති නාමය පවත්වා ගැනීම අරමුණු කරයි. මෙම දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන අංශය ඉහත ක්‍රියාකාරකම් සිදුකිරීමේ වගකීම දරන අතර එය ශ්‍රී ලාංකීය මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය පිළිබද බලයලත් ආයතනය ලෙස ක්‍රියාත්මක වේ.
මෙම අංශය ප්‍රධාන වශයෙන් ධිවර නිෂ්පාදන අපනයනයට අදාලව ධිවර හා ජලජ සම්පත් පනත යටතේ බලත්මක වන පහත රෙගුලාසි ක්‍රියාත්මක කරමින් පවති.

- 1998 මත්ස්‍ය නිෂ්පාදන (අපනයන) රෙගුලාසිය
- 2003අංක 01 දරණ මත්ස්‍ය පිරිසැකසුම් නියෝග
- 2014 මසුන් ඇල්ලීම පිළිබද දත්ත රැස්කිරීමේ නියෝග
- 2002 ජලජීවි වගා (අවශේෂ අධීක්‍ෂණ) නියෝග

2014 වසරේ සිට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තත්ත්ව පාලන උප කාර්යාලය පිහිටුවන ලදී අතර මෙම කාර්යාලය සතියේ දින හත පුරාවට දිවා රාත්‍රී දේශීය අපනයන කරුවන්ට සේවා සපයන (24X7) කාර්යාලය ලෙස ක්‍රියාත්මක වේ.

එයට අමතරව මේ වන විට දේශීය පාරිභෝගිකයා වෙත සෞඛ්‍ය ආරක්ෂිත මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන ලබා දීම පිළිබඳ අපගේ අවධානය යොමු වී ඇති අතර ඒ සඳහා අවශ්‍ය මූලික වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

තවද, තත්ත්ව පාලන අංශයේ රාජකාරී කටයුතු විධිමත් පරිදි සිදුකිරීම සඳහා පුරප්පාඩුව පැවති අනුමත නිලධාරී සංඛ්‍යාව බඳවාගැනීම් සිදු කරන ලදී. මේ අනුව මෙම අංශය තුළ තාක්ෂණික කාර්යය භාරයක් සිදුකරන තත්ත්ව පාලන නිලධාරී තනතුර සඳහා නවක නිලධාරීන් අට දෙනෙකු බඳවා ගැනීම සිදුකරන ලදී. ඒ අනුව තත්ත්ව පාලන අංශයේ ධාරිතාවය වැඩි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

එම අංශයේ ප්‍රධාන ඉලක්ක අරමුණු කාර්යයන් හා ප්‍රගතිය

**ඉලක්කය**

යුරෝපීය වෙළඳපොළට සහ අනෙකුත් විදේශීය වෙළඳපොල සඳහා අපනයනය කරන මත්ස්‍ය නිෂ්පාදන සම්බන්ධයෙන් යුරෝපීය කොමිසම විසින් නියම කර ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කරන ලද මෙම අංශය 1999.01.04 දින සිට ක්‍රියාත්මක වූ අතර මේ වනවිට ශ්‍රී ලංකාව විසින් මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සිදු කරන සියලුම රටවල් සඳහා එම රටවල නිත්‍යානුකූල අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය කාර්ය භාරය ඉටු කිරීම සිදු කරයි.

**අරමුණ**

1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත යටතේ බලාත්මක වන මත්ස්‍ය නිෂ්පාදන (අපනයන) රෙගුලාසි ක්‍රියාත්මක කිරීම යටතේ ශ්‍රී ලංකාව විසින් මානව පරිභෝජනය සඳහා ජාත්‍යන්තර වෙළඳපොළට අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය ඉහල නැංවීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ.

**කාර්යයන්**

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තත්ත්ව පාලන අංශය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

- මත්ස්‍ය පිරිසැකසුම් ආයතන සඳහා අනුමැතිය ලබා දීම හා ඒවාට අදාල බලපත්‍ර නිකුත් කිරීම.
- මත්ස්‍ය පිරිසැකසුම් ආයතනවලට අපනයනය සඳහා මසුන් සකස් කිරීමට බලය ලබාදීම.
- HACCP ක්‍රමවේද විශ්ලේෂණ කිරීම හා එම ක්‍රමවේදයන් සඳහා අනුමැතිය ලබා දීම.
- මත්ස්‍ය පිරිසැකසුම් ආයතන නිරන්තරව පරීක්ෂාවට ලක් කිරීම හා නුසුදුසුතා නිවැරදි කිරීමට මග පෙන්වීම හා අවශ්‍ය කටයුතු කිරීම.
- මසුන් ගොඩබෑමේ ස්ථාන පරීක්ෂා කිරීම හා මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අපනයනය සඳහා මසුන් සපයන ධීවර යාත්‍රා පරීක්ෂා කිරීම හා මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- මසුන් ගොඩබෑමේ ස්ථානවල සිට සැකසුම් කම්හල් වෙත මසුන් ප්‍රවාහනය පරීක්ෂා කිරීම මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අපනයනය සඳහා එක් එක් මත්ස්‍ය තොග/ ධීවර නිෂ්පාදන තොග සඳහා සෞඛ්‍ය සහතික නිකුත් කිරීම.
- අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදනවල සෞඛ්‍ය ආක්ෂිතභාවය තහවුරු කරන පරීක්ෂණ වාර්තා (Test Report) නිකුත් කරනු ලබන පරීක්ෂණාගාර අනුමත කිරීම.

- අදාල ස්ථානවලින් ලබාගත් සාම්පල අනුමත පරීක්ෂණාගාරවලදි පරීක්ෂාවට ලක් කිරීම පිණිස නිල සාම්පල පරීක්ෂා වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- මසුන් සැකසීමේ ස්ථාන, බෝට්ටු හා මසුන් ගොඩබාන ස්ථාන රෙගුලාසියේ අඩංගු අදාල කොන්දේසි වලට අනුකූල නොවන අවස්ථා වලදී ඒ සම්බන්ධව නිසි පියවර ගැනීම.
- අපනයනය කරනු ලබන මත්ස්‍ය නිෂ්පාදනවල අනාරක්ෂිත සෞඛ්‍ය තත්ත්වයන් පිළිබඳ ආනයනික රටවලින් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අදාල පියවර ගැනීම.
- මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය මෙන්ම අපනයනය සඳහා මසුන් සපයන ධීවර යාත්‍රාවල කාර්යය මණ්ඩල සඳහා මත්ස්‍ය පරිහරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ජලජජීවි වගා නිෂ්පාදන (මසුන්,ඉස්සන්) සඳහා භාවිතා වන ප්‍රතිජීවක බෙහෙත් වර්ග හා රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම පිණිස ජලජීවී වගා අවශේෂ අධීක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා එම වැඩසටහන යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- මත්ස්‍ය නිෂ්පාදන වල නිත්‍යානුකූලභාවය තහවුරු කිරීම සඳහා මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරීම.
- සතියේ දින හතම තුල පැය 24 පුරා ක්‍රියාත්මක වන කටුනායක ගුවන්තොටුපොළ තත්ත්ව පාලන උප කාර්යාල මගින් යුරෝපා රටවල් සඳහා මාර්ගගත ක්‍රමවේදය යටතේ ස්වස්ථතා සහතික නිකුත් කිරීම.
- රෙගුලාසින්ට අනුගත නොවන අවස්ථා සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ ආනයනය කරන රටවල් විසින් කරන ලද දැනුම්දීම් සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම

**ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමත මත්ස්‍ය සැකසුම් ආයතන**

යුරෝපා කොමිසමට අයත් රටවලට අපනයනය සඳහා සුදුසු, ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ අනුමත, මත්ස්‍ය පිලිසැකසුම් ආයතන සංඛ්‍යාව (2025.08 31 දිනට) 50 සිට 55 දක්වා ඉහල නංවාගැනීමට හැකි වී ඇත.

යුරෝපා කොමිසමට අයත් නොවන රටවලට පමණක් අපනයනය සඳහා අනුමත මත්ස්‍ය සැකසුම් ආයතන සංඛ්‍යාව 23 වන අතර මත්ස්‍ය ඇසුරුම් කටයුතු සඳහා අනුමත ආයතන සංඛ්‍යාව 21කි. මේ අතරින්, චීන සමූහාණ්ඩුව වෙත ආයතන 38ක්ද, සෞදි අරාබිය වෙත ආයතන 17ක්ද, රුසියාව වෙත ආයතන 18 ක්ද **අපනයන කටයුතු සිදුකරයි.**

**ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම සහ නිල සාම්පල් වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

මේ යටතේ මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන, ඉස්සන් වගා ගොවිපළ, පරීක්ෂණාගාර, ධීවර වරායන්, අපනයනය සඳහා අමුද්‍රව්‍ය සපයන ධිවර යාත්‍රා පරීක්ෂා කිරීම සහ මත්ස්‍ය නිෂ්පාදන වල සෞඛ්‍ය ආරක්ෂිත භාවය තහුවුරු කිරීම සඳහා නිල සාම්පල වැඩසටහන ක්‍රියාත්මක කිරීම අයත්වේ.

ක්ෂුද්‍රජීවි විද්‍යා පරික්ෂණ: ජලය, අයිස් සහ මත්ස්‍ය නිෂ්පාදන සඳහා මෙන්ම,
රසායනික පරීක්ෂණ: මසුන්ගේ හිස්ටමීන් ප්‍රමාණය/බැර ලෝහ/අවශේෂ අධීක්‍ෂණය සිදුකරනු ලබයි.

**වගා රසායනික අවශේෂ අධීක්ෂණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

මේ යටතේ 2002 වසරේ ප්‍රකාශිත ජලජීවී වගා අවශේෂ අධීක්ෂණ රෙගුලාසිය ක්‍රියාත්මක කිරීමට අදාල අධීක්ෂණ, පරීක්ෂණ සාම්පල ලබාගැනීම සහ විශ්ලේෂණද නීතිමය පියවර ගැනීමද සිදුවේ. ඉස්සන් අභිජනන මධ්‍යස්ථානවල ජල සාම්පල ලබා ගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි.

සාම්පල පරීක්ෂා සිදුකරන පරාමිතීන්:

- ප්‍රතිජීවක ඖෂධ
- දූෂක ද්‍රව්‍ය (බැරලෝහ කාබමේට්, පයිරත්‍රෝයිඩ්)
- කෘමිනාශක අවශේෂ
- වර්ණක (මැලකයිට් ග්‍රීන්, ලියුකොමැලකයිට්, බ්‍රිලියන්ට් ග්‍රීන්, ක්‍රිස්ටල් වයලට්)

**දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

මේ යටතේ මසුන්ගේ හා මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මක භාවය හා සෞඛ්‍ය ආරක්ෂිතභාවය ආරක්ෂා කිරීම පිළිබඳව අදාල පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීම ප්‍රධාන වශයෙන් සිදුවේ.

**2025.08.31 දිනට අදාලව තත්ත්ව පාලන අංශයේ කටයුතුවල ප්‍රගතිය**

| තත්ත්ව පාලන අංශය මගින් සිදුකරන කාර්යයන් | වාර්ෂික ඉලක්කය | ප්‍රගතිය 08.31 දිනට | ප්‍රතිශතය % |
|---|---|---|---|
| **දේශීය වෙළඳපලෙහි ඇති මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ සෞඛ්‍යාරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය තහවුරු කිරීම** | | | |
| **01.වරාය පරීක්ෂණ සිදු කිරීම.** | 10 | 2 | 50% |
| **02.මත්ස්‍ය වෙන්දේසි පොළවල් සහ පොදු මත්ස්‍ය වෙළඳ සැල් පරීක්ෂණ සිදු කිරීම.** | 4 | 1 | 25% |
| **03.දැනුවත් කිරීමේ වැඩසටහන් (ධීවර කාර්මිකයන්/වෙළෙඳුන්)** | 10 | 7 | 70% |
| **අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්ගේ සෞඛ්‍යාරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය තහවුරු කිරීම** | | | |
| **01.නිල සාම්පල ලබා ගැනීම - ආයතන** | 300 | 177 | 59% |
| **02.දැනුවත් කිරීමේ වැඩසටහන් (තත්ත්ව පාලන නිලධාරීන් /අදාල ක්ෂේත්‍ර නිලධාරීන්)** | 10 | 8 | 80% |
| **03.දැනුවත් කිරීමේ වැඩසටහන් (ජලජීවී වගාකරුවන්/ පිරිසැකසුම් ආයතනනිලධාරීන් / ධීවර කාර්මිකයන්)** | 10 | 8 | 80% |
| **04.ධීවර වරාය වල සෞඛ්‍යාරක්ෂිතභාවය සහ සනීපාරක්ෂාව පිළිබඳ පරීක්ෂාකිරීම.** | 20 | 9 | 45% |

<table>
<tr><td colspan="2">05.ධීවර යාත්‍රාවල වල සෞඛ්‍යාරක්ෂිතභාවය, සනීපාරක්ෂක තත්ත්ව හා යහපත් පරිහරන ක්‍රම පිළිබඳ පරීක්ෂා කිරීම.</td><td>85</td><td>55</td><td>65%</td></tr>
<tr><td rowspan="2">06.අපනයනය සඳහා මත්ස්‍ය පිරිසැකසුම් සිදුකෙරෙන ආයතන පරීක්ෂාව.</td><td>සිදුකිරීමට අපේක්ෂිත ආයතන පරීක්ෂා සංඛ්‍යාව</td><td>120</td><td>68</td><td>57%</td></tr>
<tr><td>සිදුකිරීමට අපේක්ෂිත ඇසුරුම් /පොකිරිස්සන් එකතු කරන මධ්‍යස්ථාන පරීක්ෂා සංඛ්‍යාව</td><td>15</td><td>5</td><td>33 %</td></tr>
<tr><td colspan="2">07.රසායනාගාර පරීක්ෂා කටයුතු සිදු කිරීම.</td><td>5</td><td>2</td><td>40%</td></tr>
<tr><td colspan="2">08.අභිජනන මධ්‍යස්ථාන, මිරිදිය ජලජීවී වගා ගොවිපල සහ කිවුල්දිය, සමුද්‍රජීවී වගාබිම් පිළිබඳ පරීක්ෂා කිරීම.</td><td>40</td><td>16</td><td>40 %</td></tr>
<tr><td colspan="2">09.ජලජීවී වගා රසායන අවශේෂ පිළිබඳ සිදුකරන රසායනාගාර පරීක්ෂණ</td><td>යුරෝපා කොමිසම සහ එක්සත් රාජධානියමගින් නිර්දේශිත සැලැස්මට අනුකූලවවාර්ෂික ව තීරණය වේ. (66)</td><td>66</td><td>-</td></tr>
<tr><td colspan="2">10. ගොඩබෑමේදී/ පිරිසැකැස්මේදී ඉන්ද්‍රීය විභාජක පරීක්ෂා</td><td>70</td><td>16</td><td>21.5%</td></tr>
<tr><td colspan="2">11. කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයන් මගින් ස්ථාපිත සංඛ්‍යාලේඛන දත්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.</td><td>අවස්ථානුකූව</td><td>4</td><td>-</td></tr>
<tr><td colspan="2">12. අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන් සඳහා නිල සාම්පල වැඩසටහන අනුව සිදුකල පර්යේෂණ ප්‍රතිඵළ ප්‍රමිතීන්ට අනුකූල නොවන අවස්ථා සඳහා ගනු ලබන නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම.</td><td>ප්‍රතිඵල වල පාරාමිතීන්ගේ සම්මත අගයන් ඉක්මවා යාම සිදු වුවහොත්අවස්ථා නුකූව</td><td>03</td><td>-</td></tr>
<tr><td colspan="2">13. ආනයනික රටවල් (Importing countries) මඟින් මතස්‍ය නිෂ්පාදන වල නුසුදුසුතා පිළිබඳව සිදුකරන දැනුම් දීම.</td><td>අදාල රටවලින් නුසුදුසුතා දැනුම් දෙන වාර ගණන අනුව අවස්ථානුකූව</td><td>12</td><td>-</td></tr>
<tr><td rowspan="2">14. අපනයනය සඳහා මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන අනුමත කිරීම.</td><td>නව මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන අනුමත කිරීම.</td><td rowspan="2">63</td><td>65</td><td>-</td></tr>
<tr><td>මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන ලියාපදිංචිය යාවත්කාලීන කිරීම.</td><td>02</td><td>-</td></tr>
<tr><td colspan="2">15. මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරීම.</td><td>17,000</td><td>19,200</td><td>113%</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| **16. අපනයනය සඳහා ස්වස්ථතා සහතික නිකුත් කිරීම. (යුරෝපා රටවල් සඳහා** | 18,000 | 13,938 | 77.4% |
| **17. අපනයනය සඳහා ස්වස්ථතා සහතික නිකුත් කිරීම. (යුරෝපා නොවන රටවල් සඳහා)** | 10,000 | 11,762 | 117.6% |
| **18. ප්‍රති අපනයනය සඳහා ආනයනය කරන ලබන මත්ස්‍ය තොග පිළිබඳව පරීක්ෂණසිදු කිරීම. (BIA)** | ප්‍රති අපනයනය සඳහා මසුන් ආනයනය කිරීමට ඉල්ලීම් කිරීමත් අනුමැතීන් ලබා දීමත් මත අවස්ථානුකූව | 1 | - |
| **19. යුරෝපා කොමිසම සහ අනෙකුත් රටවල අදාල නිසි බලධාරී ආයතන (Competent Authorities) සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වා ගෙනයාම සඳහා ආනයනික රටවල් මගින් සිදුකරන දැනුම්දීම් මගින් හෝ විදේශවල පිහිටුවා ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාල වලින් කෙරෙන විමසීම්.** | සිදු කරන ඉල්ලීම් අනුව අවස්ථානුකූව | 35 | - |

**ටින් මාළු කර්මාන්තය නියාමනය කිරීම**

වර්තමායේ ශ්‍රී ලංකාව තුල ප්‍රචලිත වෙමින් පවතින ටින් මලු කර්මාන්තය අගය වැඩි කිරීමේ නිෂ්පාදනයක් ලෙස සැලකිය හැකි අතර එය දිගින් දිගටම ඉල්ලුම වැඩිවන ප්‍රෝටීන් වලින් ඉහල ටුනා, සාඩින් හා මැකරල් මත්ස්‍ය විශේෂ යොදා ගනිමින් දිගු කාලයක් කල් තබා ගත හැකි පසසුවෙන් සකස්කර ගත හැකි නිෂ්පාදනයකි. ශ්‍රී ලංකවේ මෙම ටින් මාළු වෙළඳපොළ සම්පූර්ණයෙන්ම ආනයන වෙළඳපොළ මත රදා පැවති අතර මේ වන විට මෙය දේශීය කර්මාන්තයක් බවට පත් කර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටි. දැනට ටින් මාළු නිෂ්පාදන කිරීම සඳහා දායකත්වය ලබා දෙන දේශීය ව්‍යාපාරිකයින් 22 දෙනෙකු පමණ හඳුනා ගෙන එම නිෂ්පාදන වල සෞඛ්‍ය ආරක්ෂිතභාවය හා ගුණාත්මකභාවය ඉහල නැංවීමේ මුලික කටයුතු තත්ත්ව පාලන අංශයේ මැදිහත් වීමෙන් ආරම්භ කර ඇත. ඒ අනුව ටින් මාළු ආනයනය සඳහා වැය වන විදේශ සංචිත අප රට තුල රදවා ගැනීමට අපේක්ෂිතය.

තවදුරටත් මෙම කර්මාන්තය නියාමනය කිරිමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින අතර අදාල ටින් මාළු පිරිසැකසුම් කිරීමේ ආයතන 2003 අංක 1 දරන මත්ස්‍ය පිරිසැකසුම් ආයතන නියෝග යටතේ අප දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම, මේ වන විට ධිවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන අංශය විසින් ආරම්භ කර ඉදිරි පියවර ගනිමින් සිටි. දැනට 2003 අංක 01 දරණ මත්ස්‍ය පිරිසැකසුම් ආයතන නියෝග යටතේ ආයතන 12 ක් ක්‍රියාත්මක වේ.



ඡායාරූපය 01 හා 02: ටින් මාළු නිෂ්පාදන කිරීම සඳහා දායකත්වය ලබා දෙන දේශීය ටින් මාළු ආයතන පරික්ෂා කිරිම

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන අංශයේ නිලධාරීන් සඳහා විෂ සහිත මත්ස්‍ය ප්‍රභේද පිළිබඳ NARA ආයතනය සමග එක්ව දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම**

ශ්‍රී ලංකා මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන අපනයනයේදී වැදගත් වන යුරෝපා කොමිසමේ අවශ්‍යතාවට අදාළව මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුමේදී විෂ සහිත මත්ස්‍ය ප්‍රභේද පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදු කරන ලදී.

එහිදී මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මක භාවය සහ සෞඛ්‍ය ආරක්ෂිත භාවය නියාමනයට අදාලව නිලධාරීන්ගේ දැනුවත් බව වැඩි කරන ලදී



ඡායාරූපය 03 හා 04: තත්ත්ව පාලන අංශයේ නිලධාරීන් සඳහා විෂ සහිත මත්ස්‍ය ප්‍රභේද පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

**එක් දින කුඩා යාත්‍රා මගින් රැගෙන එන මත්ස්‍ය අස්වැන්න අපනයන වෙළඳ පොල වෙත යොමු කිරිමට හැකි වන පරිදි ත්ත්වයෙන් උසස් සෞඛ්‍යාරක්ශිත මත්ස්‍ය අස්වැන්නක් ගොඩබිමට රැගෙන ඒම දිරිගැන්වීම**

ශ්‍රී ලංකාවේ වෙරළබඩ ධීවර කර්මාන්තය රටේ ආර්ථිකයේ, සංස්කෘතියේ සහ ආහාර සුරක්ෂිතතාවයේ වැදගත් අංගයක් වන අතර ජනගහනයෙන් සැලකිය යුතු කොටසකට ජීවනෝපායන් සපයන අතර ජාතික මත්ස්‍ය නිෂ්පාදනයට දායක වේ.

මෙම කුඩා යාත්‍රා මගින් නෙලාගන්නා වෙරළබඩ ධීවර කර්මාන්තය රටේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයට සැලකිය යුතු දායකත්වයක් සපයන අතර, අල්ලා ගන්නා ප්‍රමාණයෙන් සැලකිය යුතු කොටසක් අපනනය කල හැකි මත්ස්‍යයන් විශේෂ වේ.

වෙරළබඩ ධීවර කර්මාන්තය මගින් විශේෂ රාශිය කින් යුත් අපනයන ඉල්ලුමක් සහිත අස්වැන්නක් නෙලා ගත්තද එසේ නෙලා ගැනීමේදී හා ගොඩබිමට රැගෙන ඒමේදී සිදුවන දුර්වල පරිහනන තත්වයන් නිසා අදාල මත්ස්‍ය නිෂ්පාදන වල තත්ත්වය අඩුවීම මගින් අදාල අස්වැන්න අපනයන අමුද්‍රව්‍ය ලෙස යොදා ගැනීමට නොහැකි තත්වයකට පත්ව ඇත .ඒ අනුව අල්ලා ගන්නා මසුන් අපනයන වෙළඳ පොල තුල විශාල ඉල්ලුමක් පවතියද ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමේ ගැටලුවක්ට අපනයනය කරුවන් මුහුන දී ඇත .

ඒ අනුව පසු අස්වනු හානිය අවම කරමින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ මත්ස්‍ය නිෂ්පාදන අපනයන වෙළඳපොළට ලබාදීම සඳහා නිවැරදි පරිහරණය ක්‍රමවේද අනුගමනය කිරීම වැදගත් වේ. ඒ සඳහා, ධීවරයන් වෙත අවශ්‍ය උපකරණ හා පහසුකම් ලබා දීම වෙනුවෙන් සහ එක් දින කුඩා යාත්‍රා මගින් නෙලා ගනු ලබන මත්ස්‍ය අස්වැන්න ආරක්ෂිතව ගොඩබිමට ගෙන ඒම දිරිගැන්වීම සඳහා වන වැඩසටහන් හලාවත, කලුතර සහ මීගමුව යන ධීවර දිස්ත්‍රික්ක වල සිදුකරන ලදී. මේ සඳහා මත්ස්‍ය අපනයනකරුවන් සහ ධීවර කාර්මිකයින් සහභාගී වූ අතර ගුණාත්මක මත්ස්‍ය අස්වනුවල අවශ්‍යතාවය පිලිබඳව තොරතුරු හුවමාරු කරගැනීම ද සිදුවිය.




ඡායාරූපය 04 හා 05 : 2025.06.25 දින හලාවත ධීවර දිස්ත්‍රික්කය සඳහා රැස්වීම පවත්වන අයුරු දැක්වෙන ඡායාරූපය




ඡායාරූපය 06 හා 07: 2025.07.03 දින කලුතර ධීවර දිස්ත්‍රික්කය සඳහා රැස්වීම පවත්වන අයුරු දැක්වෙන ඡායාරූපය



ඡායාරූපය 07 හා 08: 2025.07.09 දින මීගමුව ධීවර දිස්ත්‍රික්කය සඳහා රැස්වීම පවත්වන අයුරු දැක්වෙන ඡායාඡායාරූපය

**ධීවර නිෂ්පාදන අපනයන, ආනයන සහ ප්‍රතිඅපනයන කළමනාකරණ නියාමනය (ප්‍රති අපනයනය) සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය ( SOP)**

මේ වන විට ශ්‍රී ලංකාවේ අනුමත මත්ස්‍ය පිරිසැකසුම් ආයතනය වල ධාරිතාවය හා විදේශීය ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම සපුරාලීමට නොහැකි තත්වයකට වර්තමානයේ ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනකරුවන් පත්ව ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයන කර්මාන්තය තිරසාරව අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා තත්වයෙන් උසස් අපනයනයට සුදුසු මට්ටමේ අමුද්‍රව්‍ය හිඟ කමක් හඳුනාගෙන තිබූ අතර එම හේතුවෙන් සමහර පිළිසැකසුම් ආයතන වැසි යාමේ අවදානමකට ලක්ව ඇති බව හඳුනා ගන්නා ලදී. ඒ අනුව දීර්ඝ කාලින අපනයනකරුවන් විසින් සිදු කරනු ලබන ඉල්ලීම් අනුව මත්ස්‍ය අපනයනය තිරසාරව පවත්තවා ගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය ටූනා, තලපත් හා ඉස්සන් ආනයනය කර දේශියව පිළිසකර කර නැවත ප්‍රති අපනයනය කිරීම සඳහා පහසුකම් සැලසීමට අදාල පාර්ශවයන් තීරණය කරන ලදී. ඒ අනුවඅදාල පාර්ශවකරුවන්ගේ එකගතාවයන් සහිතව මෙහෙයුම් ක්‍රියා පටිපාටිය සැකසීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකාවට ටූනා, තලපත් හා ඉස්සන් ආනයනය කිරීම සඳහා විධිමත් ක්‍රියා පටිපාටි සහිත කොන්දේසි සහිත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (sop) දෙකක් ස්ථාපිත කර බලපත්‍රලාභී මත්ස්‍ය සැකසුම් ආයතන හරහා අගය එකතු කිරීම සහ පසුව ප්‍රති අපනයනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මෙහි සියළුම අධීක්ෂණ කටයුතු අප අංශය විසින් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

ශ්‍රී ලංකාව ප්‍රමුඛතම මුහුදු ආහාර සැකසුම් මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීමෙන් මුහුදු ආහාර අපනයන පහත වැටීමට පිළියම් යෙදීම, විශේෂයෙන් අපනයන අරමුණු සඳහා ආනයන සඳහා පහසුකම් සැලසීම මෙහි අරමුණයි. එහි උපායමාර්ගික පිහිටීම, දියුණු යටිතල පහසුකම්, ශක්තිමත් ආරක්ෂාව සහ කළමනාකරණ ක්‍රියාපටිපාටිය සහ දක්ෂ ශ්‍රම බලකාය උපයෝගී කරගනිමින්, ගෝලීය මුහුදු ආහාර වෙළඳාම තුළ රටේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම මෙම මුලපිරීමේ අරමුණයි.

## 2.1. විශේෂ ජයග්‍රහණ

01. යාත්‍රා යෙදවුම් පිළිබඳ නිවැරදි දත්ත නොමැතිවීම හා දත්ත යාවත්කාලීන නොවීම හේතුවෙන් ධීවර කර්මාන්තය කළමණාකරනය සඳහා වන ගැටළු අවම කිරීම සඳහා සියලුම දිස්ත්‍රික්ක සහ ධිවර තොටුපළවල් ආවරණය වන පරිදි ධිවර යාත්‍රා සංගණනයක් 2025 අගෝස්තු මාසයේ ක්‍රියාත්ම කිරීම මගින් ක්‍රියාත්මක යාත්‍රා, ක්‍රියාත්මක නොවන යාත්‍රා සහ අබලන් ලියාපදිංචිය අවලංගු කර යුතු යාත්‍රා පිළිබඳ තොරතුරු රැස්කිරීම.





02. සුළුපන්න ධිවර කර්මාන්තය කළමණාකරණය සඳහා වන ජාතික සැලැස්ම සකස් කිරීම පිළිබඳව නොවැම්බර් මස 20 – 22 දත්වා කොළඹදි ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය(FAO) බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ජාත්‍යන්තර සංවිධානය(BOBP_IGO) හා එක්ව ජාත්‍යන්තර සමළුවක් පැවැත්වීම සහ එයට සමගාමීව සුළුපන්න ධිවර කර්මාන්තය කළමණාකරණය සඳහා වන ජාතික සැලැස්ම සකස් කිරීම ආරම්භ කළ දකුණු ආසියාවේ පළමු රට ලෙස ශ්‍රී ලංකාව එම සැලැස්ම සකස් කිරීම.






3. Aqua Planet-2025 ප්‍රදර්ශනය සාර්ථකව පැවැත්වීම.




4. විදේශිය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම.

| අත්අඩංගුවට පත් ධීවරයින් සංඛ්‍යාව | මුදාගත් ධීවරයින් සංඛ්‍යාව | අත්අඩංගුවට පත් යාත්‍රා සංඛ්‍යාව | අත්අඩංගුවට පත් ධීවරයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| **93** | 83 | 18 | 10 |

5. විදේශීය රටවලදී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදාගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම.

| මුදා ගැනීමේ කටයුතු සිදු කළ ධීවරයින් සංඛ්‍යාව | මුදා ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය කළ ධීවරයින් සංඛ්‍යාව | නැව් වල හැපී විනාශ වූ යාත්‍රා | අත්හැර දමන ලද බහු දින යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|---|
| **1248** | 228 | 05 | 05 |

6. බහු දින ධීවර මෙහෙයුම් සිදු කරන යාත්‍රාවල තොරතුරු සත්‍යාපනය කිරීම.

| | | |
|---|---|---|
| **1.** | **බහු දින ධීවර මෙහෙයුම් වලට අදාළව ඒකකය වෙත ලැබුණු ලොග් පිටපත් ගණන** | **5436** |
| **2.** | බහු දින ධීවර මෙහෙයුම් වලට අදාළව නිකුත් කරන ද සත්‍යාපන වාර්තා ගණන | 5436 |

7. බහුදින යාත්‍රාවලින් සිදුකරන මෙමෙහයුම්වලට අදාළ ධීවර ලොග් පත්‍රිකා එකතු කිරීම.

| | | |
|---|---|---|
| **1.** | **වරාය මෙහෙයුම් කාර්යාල වෙත ලැබුණු ධීවර ලොග් පත්‍රිකා ගණන** | **37,015** |
| **2.** | ලොග් දත්ත පද්ධතිය වෙත ඇතුළත් කරනලද ගණන | 32,656 |

8. තොරතුරු තාක්ෂණය භාවිතයෙන් සේවා සැපයීමේ ප්‍රගතිය

| | | |
|---|---|---|
| **1.** | **මාර්ගගත ක්‍රමයට යාත්‍රා සඳහා ගමන්වාර ලබා දීම.** | **74519** |
| **2.** | IOTC අවශ්‍යතා සඳහා පවත්වා ගනු ලබන දත්ත පද්ධතිය වෙත ඇතුළත් කරන ලද යාත්‍රා ඡායාරූප වාර්තා ගණන | 143 |
| **3.** | AIS උපකරණ නීත්‍යානුකූලව ලියාපදිංචි වීම | 223 |

**ඩිජිටල්කරණයේ ජයග්‍රහණ**

1. දෙපාර්තමේන්තුවේ සේවාවන් ජාලගත මෘදුකාංගය මගින් ක්‍රියාත්මක කිරීම.




රූපය : MSDFAR

දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය සංවර්ධනය කරනුයේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් 34 කට වැඩි ප්‍රමාණයක් ඩිජිටල් ක්‍රියාවලියක් බවට පරිවර්තනය කිරීමටයි.

ධීවරයින් ලියාපදිංචි කිරීම, බෝට්ටු ලියාපදිංචි කිරීම, විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම යනාදිය හා තවත් බොහෝ ක්‍රියාදාමයන් ඊට ඇතුළත්ය. මෙම යෙදුම දැනට Cloud සර්වර් පද්ධතියක් තුළ ක්‍රියාත්මක වන අතර එය http://msdfar.com භාවිතයෙන් ප්‍රවේශවිය හැකිය. යෙදුම ට අදාල දැනටමත් නිලධාරී මාර්ගගත පිවිසුම් 700කට වඩා ස්ථාපනය කර ඇති අතර අනුවාද යාවත්කාලීන කිරීම් කිහිපයක් සිදු කර ඇත. දෙපාර්තමේන්තු ජාල මෘදුකාංගය භාවිතා කරමින් ධීවරයින් 62,000 ක්, යාත්‍රාංගන 99ක් (පැරණි දත්ත ඇතුළුව), බෝට්ටු 31,000කට වැඩි ප්‍රමාණයක්, නියමුවන් 7300ක් දැනටමත් ලියාපදිංචි කර ඇති අතර මෙම වසර තුල පමණක් මෙහෙයුම් බලපත්‍ර 7,000කට වැඩි ප්‍රමාණයක් නිකුත්කර ඇත. නිකුත් කල මුළු බලපත්‍ර ප්‍රමාණය 15000 ඉක්මවා ඇත. 2024 වර්ෂය සඳහා මාර්ගගත පිටත්කිරීමේ පද්ධතිය හරහා මාර්ගගත පිටත්කිරීම් 266,800කට වැඩි ප්‍රමාණයක් සිදුකරනලදී. මෙම ක්‍රියාවලිය 2021 වර්ෂයේ සිට අඛණ්ඩව සිදුකරමින් පවතී. 2022 වර්ෂයේ හොඳම ජාලගත මෘදුකාංගය ලෙස MSDFAR පද්ධතිය සඳහා ජාලගත මෘදුකාංග භාවිතා කරන රාජ්‍ය ආයතන තේරීමේ තරගාවලියෙන් රන් පදක්කමක් ද, 2024 රාජ්‍ය සේවා හොඳම නවා නිෂ්පාදනය/ ව්‍යාපෘතිය තේරීමේ තරඟාවලියෙන් දෙවන ස්ථානය ද හිමි විය.

**02.**දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය.
[www.fisheriesdept.gov.lk](http://www.fisheriesdept.gov.lk).




රූපය : නිල වෙබ් අඩවිය

දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ නඩත්තුව සහ අන්තර්ගත කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ අංශය වගකීම දරයි. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය දිනපතා යාවත් කාලීන වන අතර දෙපාර්තමේන්තු ක්‍රියාදාමයන් පිළිබඳ විස්තර ඇතුළත් වේ. දෙපාර්තමේන්තුවේ සෑම අංශයකටම හා සෑම දිස්ත්‍රික් කාර්යාලයකටම තමන්ගේම පිටුවක් ඇති අතර එහි එම අංශය වගකිවයුතු ක්‍රියාකාරකම් ඇතුලත් කර තිබේ. නිලධාරීන්ගේ සම්බන්ධතා තොරතුරු වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර ඒවා නිරන්තරයෙන් යාවත්කාලීන වේ. වෙබ් අඩවියේ ඇති ප්‍රවේශය හරහා නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේම සියලුම පද්ධතියට ප්‍රවේශවිය හැකිය. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හොඳම සිංහල වෙබ් අඩවිය සඳහා රන් පදක්කම සහ 2020 හොඳම වෙබ් තරඟයේ හොඳම රජයේ වෙබ් අඩවිය සඳහා කුසලතා ත්‍යාගය දිනාගත්තේය.

03. තාක්ෂණික ගැටළු තත්‍යකාලීනව විසඳීම සඳහා Inquiry Management System ක්‍රියාත්මක කිරීම.

ප්‍රධාන කාර්යාලය , ධීවර දිස්ත්‍රික් කාර්යාල හා වරාය කාර්යාල වෙතින් තොරතුරු තාක්ෂණ අංශය වෙත පැමිණෙන තාක්ෂණික ගැටළු තත්‍යකාලීනව විසඳීම සඳහා inquiry Management System ක්‍රියාත්මක කිරීම. මෙම පද්ධතිය මඟින් දෛනිකව ලැබෙන ගැටළු තත්‍යකාලීනව විසඳනු ලබයි. මෙම ක්‍රමය මගින් තොරතුරු තාක්ෂණ අංශය වෙත යොමුවන ගැටළු විසඳා ගැනීමේ ප්‍රතිශතය 99% පමණ වේ. යොමුවන ගැටළු වල විස්තරයක් පහත දැක්වේ.







4.දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ජාලගත මෘදුකාංග භාවිතය පිළිබඳව නිලධාරී පුහුණුව.

ධීවර දිස්ත්‍රික්ක 15 හි මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කරන ආකාරය වෙන වෙනම නිරීක්ෂණය කරන අතර ඒ සඳහා අප අංශයේ නිලධාරීන් කැපවී සිටී. 2025 වසරේදී දිස්ත්‍රික්ක 15ම ආවරණය වන පරිදි ධීවර ලියාපදිංචිය සඳහා පුහුණුවක් අදාළ දිස්ත්‍රික්කය වෙත ගොස් අප තොරතුරු තාක්ෂණ අංශයේ නිලදාරීන් විසින් සිදු කරන ලදි. එසේම දිස්ත්‍රික් ධීවර නිලධාරීන්ට මාර්ගගත පද්ධතීන් පිළිබඳ පුහුණුවක් ප්‍රධාන කාර්යාලයේ පැවැත්වීමට සූදානම් කළද යටිතල පහසුකම් මදි වීම හේතුවෙන් දිස්ත්‍රික්ක 6ක නිලධාරීන්ට පමණක් එම පුහුණුව ලබා දෙන ලදි. 2026 වසරේදී ඉතිරි දිස්ත්‍රික්ක වල ධීවර නිලධාරීන්ට හා ප්‍රධාන කාර්යාලීය නිලධාරීන්ට එම පුහුණුව ලබා දීමට නියමිතය.









**5. “Ditwah” සුළි කුනාටුව නිසා ධීවර ප්‍රජාව වෙත සිදු වූ ආපදාවන් ඇතුළත් කිරීම සඳහා මාර්ගගත disaster management system ක්‍රියාත්මක කිරීම.**

Ditwah සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ ධීවර යාත්‍රා, යාත්‍රාංගන, ආම්පන්න , ප්‍රජා ශාලා හා ධීවර ප්‍රජාවගේ රැකියාව සම්බන්ධ උපකරණ හා ගොඩනැගිලි සම්බන්ධව රජය දැනුවත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය මඟින් Fisheries Disaster Management System ස්ථාපනය කරන ලදි.මෙම පද්ධතිය හරහා සියළුම ධීවර දිස්ත්‍රික්ක වල නිලධාරීන් විසින් තම දිස්ත්‍රික්කයට අදාළ දත්ත හා තොරතුරු ඇතුළත් කරයි.




රූපය : Disaster management system

**6.** නිලදාරීන්ට අතිකාල දීමනා ගෙවීම සඳහා මාර්ගගත පද්ධතියක් **(Online over Time management System)** ආරම්භ කරන ලදි.

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ලංකාව පුරා ධීවර දිස්ත්‍රික් කාර්යාල 15ක් ප්‍රමුඛව වරාය කාර්යාල වල ද සේවය කරනු ලබයි. මෙම සියළුම නිලදාරීන් හට අතිකාල අදාළ මාසයන් තුළ දී නිවැරදිව හැකි ඉක්මනින් ලබා දීම සඳහා මුදල් අංශය හා සම්බන්ධ වී තොරතුරු තාක්ෂණ අංශය අතිකාල ගෙවීම සඳහා මාර්ගගත පද්ධතියක් හඳුන්වා දෙන ලදි. මේ පද්ධතිය මඟින් නිලධාරීන්ගේ අතිකාල පැය ගණන නිවැරදිව ගණනය කිරීමට හා අදාළ අතිකාල දීමනාව නිවැරදිව නිලදාරීන් හට ලබා දීමට හැකිවිය.




රූපය : Online Over Time management System

## 7 . KPI (Key Performance Indicator) System

තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන් හට තම තමන්ගේ වැඩ රාජකාරීන් අනුව එම රාජකාරියට අදාළ ඉලක්ක සපුරා ගැනීම උදෙසා නිලදාරීන්ගේ ප්‍රගතිය මැනීමට KPI (Key Performance Indicator) system එකක් අත්හදා බැලීමක් ලෙස ස්ථාපනය කරන ලදි. මේ අනුව එක් එක් නිලධාරීන්ට කාල රාමුවකට අනුව තම තමන්ගේ ඉලක්ක සපුරා ගැනීම සඳහා මාර්ගගත පිවිසුමක් (Online login) ලබා දී ඒ අනුව කටයුතු කිරීමට යොමු කරන ලදි. නිලධාරී හිඟතාව හේතුවෙන් අදාළ කාලරාමුව තුළ රාජකාරිය ඉටු කිරීමට පිලිබඳ අදහසක් මෙම නිලධාරින්ට මෙම පද්ධතිය හරහා ලබා ගත හැක.




රූපය : Disaster management system

## 8 .නිවාඩු කළමනාකරණ පද්ධතිය (Leave Management System)

පැය 24 පුරාවටම දිස්ත්‍රික් කාර්යාල හා වරාය කාර්යාල වලින් විවිධ පරිශීලකයින් ප්‍රවේශවන පද්ධතීන් කිහිපයක් තොරතුරු තාක්ෂණ අංශය හරහා ක්‍රියාත්මක වන බැවින් සීමිත නිලධාරීන් පිරිසක් මඟින් මෙම කටයුතු සිදු කිරීම අපහසු වීඇත. එමෙන් ම නිලධාරීන් නිවාඩු ඉල්ලීම් කිරීම නිසා ද රාජකාරීන් වලට අපහසුතා සිදු විය හැකි බැවින් එය අවම කිරීම සඳහා මාර්ගගතව නිවාඩු කළමනාකරණය කිරීම සඳහා පද්ධතියක් අත්හදාබැලීමක් ලෙස තොරතුරු තාක්ෂණ අංශය තුළ ස්ථාපනය කරන ලදි. මෙය ආයතන සංග්‍රහය අනුව නිලධාරීන් නිවාඩු ඉල්ලුම් කරන පොදු 125 ආකෘතිය අනුව සකසන ලද මාර්ගගත පද්ධතියකි.




රූපය : Leave Management System

## 9 Online Payment Portal

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවන විවිධ පාර්ශවකරුවන්ට විවිධ අවස්තාවන් වලදී ගෙවීම් කටයුතු සිදු කිරීමට සිදුවේ. යාත්‍රා හිමිකරුවන් මෙන්ම විවිධ පුද්ගලික ආයතනවලට ද මෙසේ ගෙවීම් හා සම්බන්ධ වීමට සිදුවන බැවින් කාල කළමනාකරනය කර ඉක්මනින් ගෙවීම් කටයුතු සිදු කිරීමට තොරතුරු තාක්ෂණ අංශය හරහා Online Payment Portal ස්ථාපනය කරන ලදි. විවිධ බලපත්‍ර ගාස්තු, ලියාපදිංචි ගාස්තු හා වෙනත් ගෙවීම් කටයුතු පහසුවෙන්,ආරක්ෂිතව මාර්ගගත ක්‍රමයට කර ගැනීමේ හැකියාව මෙම පද්ධතිය හරහා පවතී.




රූපය : Online Payment Portal

## 2.2. අභියෝග

- **තොරතුරු තාක්ෂණ අංශය**

1. යාත්‍රා නිරීක්ෂණ අංශය සඳහා නිරීක්ෂණ රාජකාරී ඉටු කිරීමට නිලධාරීන් ප්‍රමාණවත් නොවීම
2. මුළු දිවයින පුරා 24*7 මාර්ගගත ක්‍රමයට බලපත්‍ර නිකුත් කරන MSDFAR පද්ධතිය යාවත්කාලීන කිරීමට හා තොරතුරු තාක්ෂණික ගැටළු විසඳීමට ප්‍රමාණවත් නිලධාරීන් තොරතුරු තාක්ෂණ අංශය සතු නොවීම .
3. සයිබර් ආරක්ෂාව සම්බන්ධයෙන් ආයතනය සමඟ කිරීමට අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

- **සංවර්ධන අංශය**

1. තොටුපල ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් හඳුනා ගැනීම, අයිතිය තහවුරු කර ගැනීම හා පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමේදී පැන නගින ගැටළු.
2. නිරන්තරයෙන් ස්වාභාවික විපත් හා කාලගුණික විපර්යාස නිසා වෙරළාසන්න පරිසර පද්ධතියට සිදුවන බලපෑම්
3. ධීවරයින් රක්ෂණය කිරීම අප විසින් ප්‍රවර්ධනය කල ව ඇතැම් ධීවරයින් ජීවිත රක්ෂණාවරණ ලබා ගැනීමට මැලිකමක් දැක්වීම.

- **කළමනාකරණ අංශය**

1. ඉහළ වානිජ වටිනාකමක් ඇති මුහුදු ජීවීන් අපනයනය සඳහා වැඩි ඉල්ලුමක් පැවතිය ද මෙම ඉල්ලුම සරිලන ලෙස සැපයීමක් සිදු කළ නොහැක. මෙම සම්පත් ක්ෂයවීමත් සම්පත් නෙළා ගැනීම කළමනාකරණය සඳහා දැනට ශ්‍රී ලංකාව අවට මුහුදේ පවතින මෙම ජීවීන්ගේ තොග පිළිබඳ අධ්‍යයනයක් සිදු කර නොමැති වීමත් ගැටලුවක්ව ඇත.

2. ධීවර යෙදවුම් කළමනාකරණය කිරීමේදී බහුදින යාත්‍රා නියාමනයක් සිදු කලද අඩු ආදායම්ලාභි ධිවරයන් භාවිතා කරන කුඩා යාත්‍රා නියාමනය ඔවුන්ගේ ජීවනෝපාය කෙරෙහි බලපාන බැවින් වෙරළාසන්න ධීවර කර්මාන්තයේ කුඩා යාත්‍රා ඉහළ යෙදවුමක් පැවතිය ද එම යාත්‍රා සීමා කිරීම ගැටලුවක් ඇත.

3. වෙරළාසන්න සාගර ප්‍රදේශවල මත්ස්‍ය හා ජලජ සම්පත් සීඝ්‍රයෙන් අඩුවීම හේතුවෙන් කළමනාකරණය මෙන්ම කර්මාන්තයේ යෙදෙන්නන්ගේ අදායම පහළයාමද ගැටළුවක්ව ඇත.

4. ධීවර සම්පත් කලමනාකරණය සඳහා රෙගුලාසි සකස් කිරීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ වාර්තා සහ නිර්දේශ අනිවාර්ය වන නමුත් වාර්ෂිකව ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය වෙත මේ සඳහා වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත් අවශ්‍ය ප්‍රමාණයට මෙම අධ්‍යයනයන් සිදු නොවීමත් හේතුවෙන් නිසිකලට අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම හා සංශෝධනය සිදු කළ නොහැකි වී ඇත.

- **<u>මෙහෙයුම් අංශය</u>**

1. ලොග් දත්ත පත්‍රිකා වල තොරතුරු කඩිනමින් ලොග් දත්ත පද්ධතිය වෙත ඇතුලත් කිරීමට නිලධාරීන් ප්‍රමාණවත් නොවීම. [මෙය දිස්ත්‍රික් කාර්යාල වලින්, වරාය කාර්යාල වලින් හා ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් අංශයට අනුබද්ධිත ඒකකයන් හරහා සිදුකරනු ලබයි.] නමුත් දත්ත ඇතුලත් කිරීම සඳහා ධීවර නිලධාරීන් අනුයුක්ත කිරීම සුදුසු වේ.

2. E-log මෘදුකාංගය මගින් මසුන් ඇල්ලීමේ දත්ත ධීවර කාර්මිකයින් හරහා ලබා ගැනීම.

3. Landing Declaration සම්බන්ධ පෝරමය නිවැරදිව වාර්තා කිරීමට ධීවර කාර්මිකයින් යොමු කිරීම.

- **<u>තත්ත්ව පාලන අංශය</u>**

1. අපනයනය කිරීමට සුදුසු තත්වයේ දේශීය අමුද්‍රව්‍ය නොමැතිවීම.
2. යුරෝපා සංගමයේ රටවල් වලට අපනයනය කරනු ලබන මත්ස්‍ය තොග යුරෝපා සංගමයේ අනුමත පරාමිතීන්ට අනුකූලව පරික්ෂා කිරීමට අවශ්‍ය පහසුකම් පර්යේෂණාගාර වල නොමැති වීම.

- **<u>විමර්ශන හා පුහුණු අංශය</u>**

1. විමර්ශන වලදි අනාවරණය වන නඩු පැවරීම් වලදී විද්‍යුත් සාක්ෂි (Contemporaneous evidence) මත පමණක් බොහෝ අවස්ථාවන් වලදී රදා පැවතීමට සිදු වීම.
2. කොපමණ දැනුවත් කිරීම් වැඩසටහන් සිදු කළද නීති විරෝධී ක්‍රියා සම්පූර්ණයෙන් මැඩලීමට නොහැකි වීම.

## 2.3. ඉදිරි ඉලක්ක

- **සංවර්ධන අංශය**

1. ස්වභාවික විපත් හෝ වෙරළාසන්න ධීවර කර්මාන්තයට සිදුවන බාධා හේතුවෙන් ධීවර කර්මාන්තයට සිදුවන බලපෑම් අවම කිරීම (යටිතල පහසුකම් සංවර්ධනය)

2. සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මකභාවයෙන් ඉහළ කරවල නිෂ්පාදනය සඳහා වියළීමේ උපකරණ හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

3. චීන සමූහාණ්ඩු අධාර යටතේ ශ්‍රී ලංකා රජයට පරිත්‍යාග කරන ලද පෙර සවි නිවාස 500 උතුරු නැගෙනහිර පළාත්වල සක්‍රීය ධීවර කර්මාන්තයේ නියැලෙන අඩු ආදායම් ලාභී ධීවර කාර්මිකයන් වෙත බෙදා දීමේ ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන්ගේ ඉඩම්වල මෙම නිවාස ඉදිකර දීම.

4. කලපු කළමනාකරණය හා සංවර්ධනය සඳහා කලපු සීමා සලකුණු කිරීම, කලපු කළමනාකරණ ප්‍රදේශ ගැසට් කිරීම, කමිටු පිහිටුවීම හා සැලසුම් සකස් කිරීම.

5. තොටුපල ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

උදා - බීකන් පහන් ස්ථාපිත කිරීම

- **කළමනාකරණ අංශය**

1. යාත්‍රා ලේඛනය යාවත්කාලීන කිරීම
2. ධීවර යාත්‍රා සංගණනය 2025 වසර තුළ පළමු අදියර ලෙස OFRP සහ MTRB යාත්‍රා සඳහා පමණක් සිදු කළ බැවින් බහුදින යාත්‍රා (IMUL)එක්දින යාත්‍රා(IDAY) සහ යාන්ත්‍රික නොවන යාත්‍රා සංගණනය ක්‍රියාත්මක කිරිම
3. මත්ස්‍ය හා ජලජ සම්පත් කළමණාකරනය සහ අපනයනය සඳහා බලපත්‍ර ලබා දීම ඩිජිටල්කරණය කිරීම
4. මාදැල් සඳහා ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරිම මෝර මත්ස්‍ය නිෂ්පාදන අපනයනය නියාමනය සඳහා මාර්ග සැලැස්ම සකස් කිරිම සහ යාත්‍රා කළමණාකරන සැලැස්ම සකස් කිරිම
5. සහ සහාගිත්ව කළමණාකරන ඒකකය ස්ථාපිත කිරිම සහ මාම්ම් නිර්ණය කළ කළමණකරන ප්‍රදේශ සඳහා කළමණකරන හා සංවර්ධන සැලැස්ම සකස් කිරිම
6. යාත්‍රා ධීවර යෙදවුම් නියාමනය සඳහා අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම.

- **<u>මෙහෙයුම් අංශය</u>**

  1. සියලුම දිස්ත්‍රික් කාර්යාල හරහා ලොග් පොත් අංක MSDFAR පද්ධතිය වෙත ඇතුලත් කිරීමට විධිමත් වැඩපිළිවෙලක්, තොරතුරු තාක්ෂණ අංශය සමග සම්බන්ධීකරණය වෙමින් ක්‍රියාත්මක කිරීම.(2026 දෙවන කාර්තුව වනවිට සකස් කිරීම.)

  2. E-log book වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම. (10%ක් යාත්‍රාවලට 2026 වසර තුල අදාල පහසුකම් සලස්වා දීම.)

  3. Landing Declaration වැඩපිළිවෙල සකස් කිරීම. (2026 වසර ඇතුලත අපනයනය සඳහා මසුන් යොමු කරන සියළුම බහුදින යාත්‍රා සඳහා මෙය හඳුන්වා දීම.)

- **<u>විමර්ශණ හා පුහුණු අංශය</u>**

  1. වාර්ෂිකව ජාත්‍යාන්තර ධීවර වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම.

# 03. පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

### 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | තත්‍ය 2025 රු. | - 2024 රු. | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| 152,230,000 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 178,114,630 | 173,842,450.00 | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| **152,230,000** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **178,114,630** | **173,842,450** | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 2,982,118,000 | 660,489,423.00 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 325,672,024 | 264,313,408.00 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 32,710,502 | 29,753,255.00 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 5,751,016 | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **3,346,251,542** | **954,556,086** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **3,524,366,172** | **1,128,398,536** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 213,631,027 | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **3,310,735,145** | **1,128,398,536** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 952,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 717,203,243 | 624,233,273.00 | - |
| 186,595,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 152,740,944 | 161,744,364.00 | ඒසීඒ-2(ii) |
| 3,049,495,296 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,961,618,308 | 104,059,986.00 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| - | පොළී ගෙවීම් | **8** | - | - | |
| 1,401,040 | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | 1,301,040 | 43,269.00 | |
| **4,189,491,336** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **2,832,863,535** | **890,080,892** | |
| | **මූලධන වියදම්** | | | | |
| 29,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 25,199,813 | 18,496,442.00 | |
| 105,702,032 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 46,618,205 | 7,601,733.00 | **ඒසීඒ-2(ii)** |
| 6,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | 4,435,888 | 3,176,392.00 | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | | - | |
| 3,215,000 | හැකියා වර්ධනය | **14** | 3,191,628 | 1,854,472.00 | |
| 109,000,000 | වෙනත් මූලධන වියදම් | **15** | 37,641,790 | 11,263,960.00 | |
| **252,917,032** | **මුළු මූලධන වියදම් (උ)** | | **117,087,323** | **42,392,999** | |
| | තැන්පතු ගෙවීම් | | 401,278,535 | 173,107,132.00 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 30,866,421 | 33,325,953.00 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **432,144,956** | **206,433,085** | |
| 4,442,408,368 | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 3,382,095,813 | 1,138,906,976 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (71,360,668) | (10,508,440) | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (71,360,668) | - | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | | **ඒසීඒ-3** |
| | | | (71,360,668) | - | |

**3.2** <u>**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**</u>

<u>**ඒසීඒ-පී**</u>

**ඒසීඒ-පී**

## 2025 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තත්‍ය 2025 | 2024 |
|---|---|---|---|
| | - - | රු. | රු. |
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,268,325,532 | 2,217,108,554 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 65,729,573 | 67,573,654 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **2,334,055,105** | **2,284,682,208** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (181,133,641) | (255,487,108) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,268,325,532 | 2,217,108,554 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | - | 591,037 |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 246,863,214 | 322,469,725 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **2,334,055,105** | **2,284,682,208** |

පිටු අංක 07 සිට 37 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 38 සිට 55 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ක්ෂේත්‍රය පිළිබඳව ඇති දැනුම හා පළපුරුද්ද |
| **කේ.කේ.ඩී.එන්. ප්‍රියදර්ශන මයා** | ධීවර නිලධාරී | G16 Capacity Building Workshop | ඉන්දියාව | සැප්තැම්බර් 17 - 19 | මත්ස්‍ය තොග සමීක්ෂණය, ධීවර කළමනාකරණ මෙවලම්, මත්ස්‍ය අපනයනය හා තත්ත්ව පාලන කටයුතු වලට අදාළව ධීවර ක්ෂේත්‍රය පිළිබඳව ඇති දැනුම හා පළපුරුද්ද |

**2025 වර්ෂය තුල දී පුහුණු සහ දැනුවත් කිරීම් වැය ශීර්ෂයන්ට අදාලව පැවැත්වූ පුහුණු සහ දැනුවත් කිරීම් වැඩසටහන් සහ මූල්‍ය ප්‍රතිපාදන විස්තරය**

| වැය ශීර්ෂය | වියදම් වූ මුළු මුදල |
|---|---|
| **290-1-1-0-2401** | රු. 3,085,537.92 |
| **290-1-1-0-2202** | රු. 4,360,312.00 |

**<u>6.3.1. ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු අංශයේ දායකත්වය</u>**

- රාජ්‍ය නිළධාරීන්ගේ රාජකාරී සේවාවන්ට අදාළව ඔවුන්ගේ දැනුම ආකල්ප සංවර්ධනය උදෙසා ආයතනය මගින් ලබාදෙන ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා ඔවුන් යොමු කරවීම ඉතාමත් වැදගත් වේ.
- මේ යටතේ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා නිළධාරීන් යොමු කරවීම පිළිබඳව විශේෂ අවධානය යොමු කර ඇත.
- එම වැඩසටහන් දෙපාර්තමේන්තුව තුල හා වෙනත් බාහිර ආයතන වෙත නිළධාරීන් සහභාගී කරවීමෙන් සිදු කරනු ලැබේ.
- මෙම වැඩසටහන් මගින් නිළධාරීන්ට රාජකාරී ආයතනයන්හී පැවරෙන රාජකාරී ලැයිස්තුවට අනුව නිර්මාණාත්මකව සහ ප්‍රායෝගිකව එම රාජකාරී සේවාවන් සාර්ථකව සිදු කිරීමටත් හැකියාව ලැබේ. එමෙන්ම අනෙකුත් ආයතන සමඟ සම්බන්ධතාවයන් වැඩි දියුණු කිරීමටත් මෙම වැඩසටහන් මගින් අවස්ථාව ලැබේ.
- ඒ අනුව නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධනයටත් ආයතනයේ දියුණුවට නිළධාරීන්ගේ සක්‍රීය සහභාගිත්වය සහ සහයෝගය ලබා ගැනීමටත් දැනුම ආකල්ප වලින් පරිපූර්ණ නිළධාරීන් පිරිසක් රාජ්‍ය සේවය සඳහා බිහි කිරීමටත් මෙම වැඩසටහන් හේතු වේ.

**<u>නිළධාරීන් සඳහා පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන්</u>**






FISHERIES MONITOR











**<u>ධීවර කාර්මිකයන් සඳහා පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන්</u>**
















සමස්ථ ලංකා බහු දින
ධීවර යාත්‍රා හිමියන්ගේ සංගමය
All Island Multi - Day Fishing Boat



# 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ./ අනුකූල නොවේ.) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| **1.1** | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | **අනුකූල වේ.** | | |
| **1.2** | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | **අනුකූල වේ.** | | |
| **1.3** | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | X | දෙපාර්තමේන්තුවට අදාල නොවේ | |
| **1.4** | ගබඩා අත්තිකාරම් ගිණුම | **X** | | |
| **1.5** | විශේෂ අත්තිකාරම් ගිණුම් | **අනුකූල වේ.** | | |
| **1.6** | වෙනත් | **අනුකූල වේ** | | |
| 2. | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| **2.1** | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ.** | | |
| **2.2** | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | **අනුකූල වේ** | | |
| **2.3** | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| **2.4** | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| **2.5** | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** | | |
| **2.6** | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ.** | | |
| **2.7** | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ.** | | |
| **2.8** | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ.** | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ.** | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම ( මු. රෙ. 135 )** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | **අනුකූල වේ.** | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | **අනුකූල වේ.** | | |
| 3.3 | සෑම ගණුදෙනුවක් ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | **අනුකූල වේ.** | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2014 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | **අනුකූල වේ.** | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ.** | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණක සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ.** | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | **අනුකූල වේ.** | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ.** | | |
| 5 | **විගණන විමසුම** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | **අනුකූල නොවේ** | **අදාල අංශ නියමිත දිනට පිළිතුරු ලබා නොදීම** | **නියමිත දිනට පිළිතුරු ලබා දීමට කටයුතු කරන ලෙස සියලුම අංශ ප්‍රධානින් ලිඛිතව දැනුවත්කිරීම.** |

| | | | | |
|---|---|---|---|---|
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| **6.1** | මු.රෙ.134(2) DMA/ 1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ.** | | |
| **6.2** | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | **අනුකූල වේ** | | |
| **6.3** | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ (4094) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වග පිටපත් කළමනාකරණය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ.** | | |
| **6.4** | මුදල් රෙගුලාසි (3) 134ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ.** | | |
| 0.7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| **7.1** | DMA චක්‍රලේඛ 1 - 2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | **අනුකූල වේ.** | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| **8.1** | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිළ දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ.** | | |
| **8.2** | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | **අනුකූල වේ.** | | |
| **8.3** | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/05 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට | **අනුකූල වේ.** | | |

| | | | | |
|---|---|---|---|---|
| | විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| **8.4** | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | **අනුකූල වේ.** | | |
| **8.5** | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | **අනුකූල වේ.** | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| **9.1** | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| **9.2** | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | **අනුකූල නොවේ.** | **2025 වර්ෂයට අදාළව එවැනි වාහන නැත.** | |
| **9.3** | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| **9.4** | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්මු. රෙ. 103, 104 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| **9.5** | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ. | | |
| **9.6** | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | **අනුකූල නොවේ.** | 2025 වර්ෂයට අදාළව එවැනි වාහන නැත. | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| **10.1** | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ.** | | |
| **10.2** | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | **අනුකූල වේ.** | | |
| **10.3** | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් ආවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන්මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට | **අනුකූල වේ.** | | |

| | | | | |
|---|---|---|---|---|
| | එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| **11.1** | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | **අනුකූල වේ.** | | |
| **11.2** | මු. රෙ (1) 94 ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම් | **අනුකූල වේ.** | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| **12.1** | සීමාවන්වලට අනුකූල වීම | **අනුකූල වේ.** | | |
| **12.2** | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | **අනුකූල වේ.** | | |
| **12.3** | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | **අනුකූල නොවේ.** | **නීතිපති වෙත ඉදිරිපත් කර ඇත.** | **නිතිපති උපදෙස් අනුව ඉදිරියේ දී කටයුතු කිරීම.** |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| **13.1** | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ. | | |
| **13.2** | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| **14.1** | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ. | | |
| **14.2** | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළතනිරවුල් කර තිබීම | අනුකූල වේ. | | |
| **14.3** | මු.රෙ. 371 ප්‍රකාර අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ. | | |
| **14.4** | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| **15.1** | අදාළ රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල නොවේ. | **ආපසු ගෙවීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවීම** | |
| **15.2** | රැස් කර තිබූ ආදායම්,තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම් බැර කර තිබීම | අනුකූල වේ. | | |
| **15.3** | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| **16.1** | අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වා ගෙන යාම | **අනුකූල වේ** | | |
| **16.2** | කාර්යය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | **අනුකූල වේ** | | |
| **16.3** | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ.** | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| **17.1** | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| **17.2** | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ. | | |
| **17.3** | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| **18.1** | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ. | | |
| **18.2** | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ. | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| **19.1** | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | **අනුකූල වේ.** | | |
| **19.2** | කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | **අනුකූල වේ.** | . | |
| **19.3** | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම අත්සන් කර තිබීම | **අනුකූල වේ.** | | |
| **19.4** | ඉහත චක්‍රලේඛයේ 06ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ. | | |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| **20.1** | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ. | | |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. FLS/B/DFAR/2/25/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 මැයි 26 දින

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
4413
27 MAY 2026
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

ගණන්දීමේ නිලධාරි,

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**ශීර්ෂය-290 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව හා සහතික කළ මූල්‍ය ප්‍රකාශනයේ දෙවන පිටපත (සිංහල,ඉංග්‍රීසි හා දෙමළ) මේ සමඟ එවා ඇත.

පී.කේ.එම්.පී.තෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පී.කේ.එම්.පී. තෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - සම්පිණ්ඩන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන වල මුල් පිටපත මේ සමඟ ඉදිරිපත් කරමි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } FLS/B/DFAR/2/25/01    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2026 මැයි 26 දින

– 4414 –
27 MAY 2026

ගණන්දීමේ නිලධාරී

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**ශීර්ෂය-290 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය-290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරන වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ගාල්ල, මන්නාරම හා කළුතර යන දිස්ත්‍රික් ධීවර කාර්යාලවල වෙන්දේසි කළ භාණ්ඩවල පිරිවැය භාණ්ඩාගාර මුද්‍රිත SA-82 (ඒසීඒ 6) ආකෘතියෙන් හා දෙපාර්තමේන්තු පොත් වලින් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) SA 82 ආකෘතියට අනුව වර්ෂය තුළ මූල්‍ය නොවන වත්කම් අත්පත් කරගැනීම් ලෙස සඳහන් වූ රු.34,716,978 ක් සඳහා අදාළ උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) දෙපාර්තමේන්තුවට අයත් තලයඩි, මුරුක්කන්කර්නි, වඩමාරච්චි නැගෙනහිර ප්‍රදේශයේ පිහිටි ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් පිළිවෙලින් රු.1,940,000 ක් හා රු.7,770,000 ක් ලෙස තක්සේරු කර 2025 අගෝස්තු 07 දිනැති අංක SA/GFS/01/01/11/290 ලිපිය මඟින් එම වටිනාකම් දන්වා තිබුණ ද CIGAS වැඩසටහනේ එය ඇතුළත් කර නොතිබීම හේතුවෙන් රු.9,710,000 කින් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් දැක්වුනි.

(ඈ) දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් හා ගොඩනැගිලි වල CIGAS වැඩසටහනේ ඇතුළත් කළ වටිනාකම රු.993,824,490 ක්වූ අතර තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කළ වටිනාකම රු.1,169,312,900 ක්ද වූයෙන් රු.175,488,410 ක වෙනසක් නිරීක්ෂණය විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ රු.163,612,500 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව පසුව රු.11,382,500 කින් එනම් සියයට 6.9 කින් අඩුකර රු.152,230,000 ක් ලෙස සංශෝධනය කිරීමට හේතු ලෙස මත්ස්‍ය සම්පත අඩුවීම හා අපනයනය කරන ප්‍රමාණය අඩුවීමත්, සකස් කළ ටින් මාළු, දේශීය නිෂ්පාදනය කළ හැකි කරවල වර්ග ආනයනය නතර කිරීම නිසා ආනයන

බලපත්‍ර ආදායම අඩුවීමත්, යන කරුණු දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ සත්‍ය ආදායම රු.178,114,630 ක් වීමට සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට වඩා සියයට 17 කින් ආදායම වැඩිවීමට හේතු ලෙස යාත්‍රාංගන ලියාපදිංචිය අලුත් නොකරන ආයතන නැවත ලියාපදිංචිය අලුත් කිරීම සහ වර්ෂය මැද අපනයනය සඳහා නව ආයතන ලියාපදිංචි වීම ආදායම් වැඩිවීම සඳහා බලපා තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

### 3.2 වියදම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සහේතුකව පූර්වමාන කළ හැකි සියලුම සේවාවන් ඇස්තමේන්තුවට ඇතුළත් කරමින් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් තාත්විකවත් පිළියෙල කළ යුතු වුවත්, වැය විෂයයන් 02 ක් සඳහා සලසාගෙන තිබූ ප්‍රතිපාදන මුදල් රු.6,990,000 ක් වැය නොකර වර්ෂය අවසානය වන විටත් සම්පූර්ණයෙන්ම ඉතිරිව පැවති අතර වැය විෂයයන් 08 ක් සඳහා වෙන්කර තිබූ එකතුව රු.133,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.88,058,312 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සියයට 48 සිට සියයට 79 දක්වා පරාසයක පැවතුණි. තව ද වැය විෂයයන් 03 ක මූලික ඇස්තමේන්තුව සඳහා අධි ප්‍රතිපාදනයන් සලසා ගැනීම හේතුවෙන් එකී වැය විෂයයන්ගෙන් වෙනත් වැය විෂයයන් වෙත මුදල් රෙගුලාසි 66 මඟින් ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසුව ද ඉතිරිය සියයට 49 සිට සියයට 94 දක්වා පරාසයක පැවතුණි.

(ආ) වැලිගම කප්පරතොට නව ධීවර කාර්යාලය ඉදිකිරීමට අවශ්‍ය ගොඩනැඟිලි සැලසුම් සකස් කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම්, අත්පත් කරගැනීම් යටතේ රු.මිලියන 5 ක් ඇස්තමේන්තු කර ඊට අදාළව ලැබූ ප්‍රතිපාදනයෙන් ගොඩනැගිල්ලේ සැලසුම සකස් කිරීම වෙනුවෙන් සත්‍ය වියදම ලෙස රු.මිලියන 01 ක් දරා ඉතිරි වූ රු.මිලියන 04 ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

(අ) 2021 අගෝස්තු 11 දින සිට සේවය අතහැර ගොස් තිබූ සේවකයකුගෙන් අයවිය යුතු ආපදා හා විශේෂ ණය එකතුව රු.231,597 ක ශේෂයක් පැවතුණු අතර එය වසර 03 කට වැඩි කාලයක සිට අයවීමට පැවතුණ ද විගණිත දින වන 2026 මැයි 20 දින වන විටත් එම ශේෂ අයකරගෙන නොතිබුණි.

(ආ) 2024 අගෝස්තු 31 දින සිට වැඩ තහනම් කර තිබූ නිලධාරියෙකුගෙන් වර්ෂයකට වැඩි කාලයක සිට අයවීමට පැවතුණු රු.170,420 ක ආපදා ණය ශේෂය 2026 මැයි 20 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සිට සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු.86,100 ක්වූ ආපදා ණය හා උත්සව අත්තිකාරම් ශේෂය ගිණුම් සාරාංශ හරහා මෙම වාර්තාවේ දින වන විටත් නිරවුල් වී නොතිබුණි.

**3.4 තැන්පතු ගිණුම**

(අ) මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ වර්ෂ 02 ඉක්මවූ එකතුව රු.22,530,944 ක තැන්පතු ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම් අංක 6000-0-0-6-73 දරණ ධීවර ත්‍යාග අරමුදල් තැන්පතු ගිණුමේ, නඩු වාර්තාවල පවතින ගැටළු සහ නිලධාරීන් විසින් ධීවර ත්‍යාග අරමුදලින් දීමනා ඉල්ලුම් නොකිරීම යන හේතුව මත වසර 02 ත් 05 ත් අතර රු. 955,737 ක් වටිනා ශේෂ 19 ක්ද වසර 05 ට වැඩි රු.7,575,242 ක් වටිනා ශේෂ 39 ක්ද පැවතුණු අතර මෙම ශේෂයන් කඩිනමින් හිමිකම් සහිත නිලධාරීන් වෙත ගෙවීමට හා රාජ්‍ය ආදායමට බැර කළ යුතු ප්‍රතිශතයන් ගණනය කර ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

(අ) ස්වාභාවික විපත් නිසා වෙරළබඩ ධීවර කටයුතුවලට සිදුවන බාධා හේතුවෙන් ධීවර කර්මාන්තයට සිදුවන බලපෑම අවම කිරීමට යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.මිලියන 9 ක් ඇස්තමේන්තු කර සියයට 100 ක කාර්යසාධනයක් අපේක්ෂා කළ ද ඊට අදාළව ලබා කරගෙන තිබුණේ සියයට 35 ක තරම් අඩු භෞතික කාර්යසාධනයක් පමණි. ඒ අනුව 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු අපේක්ෂිත ඉලක්කයන් ලබා කරගෙන නොතිබුණි.

(ආ) 2025 වර්ෂයේ දී මෘදුකාංග සංවර්ධනය සඳහා රු.මිලියන 02 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර සියයට 100 ක කාර්යසාධනයක් අපේක්ෂා කළ ද ඊට අදාළව සියයට 50 ක භෞතික කාර්යසාධනයක් පමණක් ලබා කරගෙන තිබුණි. තවද, ගොඩබෑමේ ස්ථානවල ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා රු.මිලියන 20 ක් ඇස්තමේන්තු කර සියයට 100 ක කාර්ය සාධනයක් අපේක්ෂා කළ ද ඊට අදාළව සියයට 50 ක භෞතික කාර්යසාධනයක් පමණක් ලබා කරගෙන තිබුණි.

(ඇ) ඉලක්කයන් අවිනිශ්චිත වුවද එය පුරෝකතනය කිරීමේදී සුදුසු උපකල්පන යොදාගෙන අතීත ප්‍රමුඛතාවයන් සහ ඒවායේ විශේෂිත ලක්ෂණ කෙරෙහි අවධානය යොමුකර වෙනස්වන ආර්ථික තත්ත්වයන් මත පදනම්ව සකස් කර ගණන් දීමේ නිලධාරී විසින් අධීක්ෂණය කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ 2025 කාර්යසාධන වාර්තාවේ, කළමනාකරණ අංශය යටතේ යාත්‍රා නියමු

බලපත්‍ර නිකුත් කිරීම් ක්‍රියාකාරකමේ අපේක්ෂිත ඉලක්කය 500 ක් වුවද එහි ප්‍රගතිය සියයට 33.8 ක් එනම් 169 ක් විය. තවද හක්බෙල්ලන් අපනයනය සඳහා බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් අපේක්ෂිත ඉලක්කය 40 ක් වුවද සත්‍ය ප්‍රගතිය 24 ක් විය.

### 4.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු 2025 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම පරිච්ඡේදයේ මෙහෙයුම් අංශයේ අනුකූලතා ප්‍රගතිය 2022 වර්ෂයෙන් පසු සියයට 83 සිට සියයට 71.2 දක්වා ක්‍රමයෙන් අඩු වී තිබීමත් තත්ත්ව පාලන අංශයේ කාර්යයන් 06 ක වාර්ෂික ඉලක්කයන් ළඟා කර ගැනීමේ ප්‍රගතිය සියයට 21.5 සිට සියයට 50 දක්වා අඩු පරාසයක පැවති අතර දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්ක, අරමුණු සහ ජයග්‍රහණ දර්ශක හඳුනාගැනීමේදී ඒවා නිශ්චිත සහ මැනිය හැකි ආකාරයෙන් හඳුනාගෙන නොතිබූ බවත් නිරීක්ෂණය විය.

### 4.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) ධීවර දෙපාර්තමේන්තුවේ කලපු කළමනාකරණය විධිමත් කිරීම සංරක්ෂණය හා සංවර්ධනයට අදාළව නිල-හරිත ආර්ථික සංකල්පය යටතේ සම්පත් තිරසර ලෙස භාවිතා කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා සකස් කළ සැලසුම්වලට මීගමුව කලපුව ආශ්‍රිතව අපද්‍රව්‍ය දැමීම, කලපු තීරය ගොඩකිරීම, කඩොලාන ඉවත් කිරීම, කලපු ප්‍රදේශය ආශ්‍රිත අනවසර ඉදිකිරීම් ආදි කලපු පරිසර පද්ධතියට අහිතකර ලෙස බලපා තිබුණ ද මීගමුව කලපුව ඒ යටතට ගෙන නොතිබුණි. 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 31 වන වගන්තිය යටතේ GPS ඛණ්ඩාංක මඟින් සිතියම් ගත කර ගැසට් පත්‍රයක පළකර මීගමුව කලපුව සංරක්ෂණය කිරීම මෙම වාර්තාවේ දින වන විටත් සිදුකර නොතිබුණි.

(ආ) මුන්දලම කලපුව කළමනාකරණය විධිමත් කිරීම හා සංරක්ෂණය කිරීම පසුගිය වසර කිහිපයක දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම් තුළ ඇතුළත්ව ඇතත් 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 31 වගන්තිය ප්‍රකාරව කලපු කළමනාකරණ ප්‍රදේශයක් ලෙස මුන්දලම කලපුව ගැසට් කිරීමට හෝ එම කලපුවේ GPS ඛණ්ඩාංක සහිත මැනුම් සිතියම් සකස් කරවාගෙන නොතිබුණි. එහෙත් කලපුව සඳහා මැනුම් සිතියම් සකස් කරදෙන ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් 2025 අගෝස්තු මස 05 දින ඉල්ලීම් කර තිබුණ ද එම GPS ඛණ්ඩාංක නොමැතිව සීමා මායිම් ලකුණු කිරීමේ කාර්යය සඳහා මුන්දලම කලපුවේ ස්ථිර කණු 3,030 ක් සිටුවීමට විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව කොන්ත්‍රාත් ප්‍රධාන ලිපියක් මඟින් 2019 ජූලි 20 දින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට සීමා මායිම් කණු 1,435 ක් සිටුවා ඒ වෙනුවෙන් රු.1,435,000 ක් එම දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි. ඉතිරි කණු 1,595 පිළිබඳව 2025 අගෝස්තු 13 දින සිදුකළ භෞතික විගණන

පරීක්ෂාවේදී මුන්දලම කලපුව ආශ්‍රිතව ස්ථාන 7 ක කණු 1,305 ක් පමණක් භෞතිකව නිරීක්ෂණය වූ අතර වටිනාකම රු.404,550 ක් වූ ඉතිරි කණු 290 ක් භෞතිකව නොතිබුණි. එම කණු සිටුවීමේ දී මුන්දලම ග්‍රාම නිලධාරි කාර්යාලය අසල තිබූ කණු මාර්ගය දෙපස ගස් සඳහා ආවරණ වශයෙන් යොදාගෙන තිබූ අතර එම කලපුවේ මායිම් කණු සිටුවීමේ දී GPS ඛණ්ඩාංක සහිත මැණුම් සිතියමක් නොමැතිව පුනපිටිය, වම්බිවටාවන, පනිච්චිවිල්ලු, වටාවාන, ආඩිමුනේ, මුන්දලම හා උඩප්පුව යන ප්‍රදේශවල කලපු සීමාව සමස්තයක් ලෙස ආවරණය නොකර කොටස් වශයෙන් ස්ථිර කණු සිටුවීම පමණක් කර තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය. එම කණු සිටුවීමේදී උපරිම වඩදිය සීමාව සැලකිල්ලට ගත යුතු වුවත් එම කලපුව ආශ්‍රිතව ඉස්සන් වගා බිම් පවතින ස්ථානයන්හි කණු සිටුවීමේ දී, එම වගා බිම් අතහැර / සංරක්ෂණ සීමාවෙන් ඉවත්කර කණු සිටුවීම සිදුකර තිබුණි.

(ඈ) 2016 අප්‍රේල් 25 දිනැති අංක 1964/3-2016 අති විශේෂ ගැසට් පත්‍රය මඟින් GPS ඛණ්ඩාංක සහිතව හලාවත කලපුව හා ඊට උතුරින් මුතු පන්තිය දක්වා ඕලන්ද ඇල ධීවර කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබුණද ඊට ඇතුළත්ව තිබූ හලාවත නගරයේ හලාවත පාලමේ සිට හලාවත මෝය දක්වා ප්‍රදේශයේ කලපු මායිම කණු සිටුවා ආවරණය කර නොතිබීම හේතුවෙන් ජනගහනය බහුල, අනවසර ඉදිකිරීම් සහිත සංරක්ෂණය කළ යුතුම එම කලපු ප්‍රදේශය සංරක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 අගෝස්තු 04 දිනැති අංක 1665/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පුත්තලම කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයක් ලෙස නම් කර තිබූ අතර විගණිත දිනය වන 2025 අගෝස්තු 13 වන විට GPS ඛණ්ඩාංක සහිතව සිතියම ලකුණු කර ඇතත් එම ඛණ්ඩාංක මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙතින් මේ වනතෙක් ලබා නොගෙන GPS ඛණ්ඩාංක රහිතව පුත්තලම කලපුවේ මනතිව් සහ පුවරසන්කඩාව ප්‍රදේශවල ස්ථිර කණු 100 ක් පමණක් සිටුවා ඇතත් පාලකුලම, කල්පිටිය දූපත්, කල්පිටිය ගොඩබිම, කන්දකුලිය, වනාතවිල්ලුව, පුත්තලම ප්‍රදේශ තුළ තවත් කණු 2,104 ක ප්‍රමාණයක් සිටුවිය යුතු වුවද එය ඉටු වී නොතිබුණි.

### 4.2 ප්‍රසම්පාදනයන්

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයන් සාමූහිකවත් තනි තනිවත් ගනු ලබන තීරණ කෙරෙහි වගකිව යුතු වුවද 2019 වර්ෂයේ දී දෙපාර්තමේන්තුවට අවශ්‍ය පිරිවිතරයන්ට අනුව ගුවන් විදුලි සන්නිවේදන උපකරණ ඇනවුම් කර ඒ සඳහා රු.7,084,000 ක් ගෙවීම් කර තිබිය දී එම පිරිවිතරයන්ට අනුකූල නොවන ගුවන් විදුලි උපකරණ 07 ක් සපයා තිබූ අතර ආරම්භයේ සිට මේ දක්වාම එම යන්ත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. ඒ හේතුවෙන් ඒ පිළිබඳ සොයා බැලීමට කමිටු දෙකක්

අවස්ථා දෙකකදී පත්කර තිබුණි. එම කමිටු නිර්දේශ අනුව පිරිවිතරයන්ට අනුකූල නොවන ගුවන් විදුලි සන්නිවේදන උපකරණ සඳහා ගෙවීම් කිරීමට නිර්දේශ කිරීමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාදවීම් හා රජයට පාඩු සිදුවීමත් පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් මෙම තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්ට එරෙහිව මෙම වාර්තාවේ දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර එම කමිටු වාර්තාව අනුව 2020 පෙබරවාරි 24 හා 2020 මැයි 26 දිනයන්හිදී එම මුදල් නැවත දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කරන ලෙසත් නැතහොත් නෛතික පියවර ගන්නා බව අදාළ ආයතනය වෙත දැන්වීමට පමණක් දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණු අතර මෙම වාර්තාවේ දින වන විට වසර 06 ක් ඉක්මවා තිබුණ ද මෙම ගැටලුව නිරාකරණය වී නොතිබුණි.

### 4.3 පාඩු හා හානි

(අ) රු.7,914,548 ක් වැය කරමින් කොග්ගල ස්ථාපනය කළ මත්ස්‍ය ඒකරාශිකරණ ඇටවුම (FAD) 2024 සැප්තැම්බර් 27 දින සිට වසරක කාලයකට ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ අනපේක්ෂිත අයහපත් කාලගුණය නිසා ඇති වන හානි ආවරණය කර රක්ෂණය කර තිබිය දී 2025 ජනවාරි 14 දින එම ඇටවුම අස්ථානගත වී තිබුණි. ඒ අනුව අවස්ථා 03 කදී ශ්‍රී ලංකා රක්ෂණ සමාගමෙන් රක්ෂණ හිමිකම් ඉල්ලුම් කර ඇතත් අදාළ වන්දි මුදල ලැබී නොතිබුණි. මෙම ඇටවුම ස්ථාපිත කර මාස 02 ක් වැනි කෙටි කාලයකින් අස්ථානගත වීම නිසා ඒ තුළින් අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට හා අපේක්ෂිත ප්‍රතිලාභ ධීවර ප්‍රජාව හට ලබා දීමට අපොහොසත් වී ඇති අතර රු.7,914,548 කින් රජයට පාඩුවක් සිදු වී තිබුණි. එම අස්ථානගතවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයේ නිර්දේශය ප්‍රකාරව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ආයතනයෙන් අයකරගත යුතු රු.7,100,000 ක්වූ මුදල අයකරගෙන නොතිබුණු අතර ඒ පිළිබඳව රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත කළ පැමිණිල්ලේ ඉදිරි කටයුතු සඳහා කොග්ගල ප්‍රදේශයේ මෙම සිද්ධිය සිදු වූ කාල සීමාවේ ශ්‍රී ලංකා මුහුදු තීරයේ පැවති කාලගුණ තත්ත්වය පිළිබඳ වාර්තාවක් 2026 ජනවාරි 05 දිනට පෙර රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත යොමු කරන මෙන් දන්වා සිටිය ද 2026 අප්‍රේල් 30 දින වන තෙක්ම එකී වාර්තාව ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ 6 වන මහලේ වැසි ජලය කාන්දුවීමෙන් සිදු වූ අලාභය සම්බන්ධ මුදල් රෙගුලාසි 104 කමිටු වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන යටතේ හානි පාඩු ලෙස රු.16,519,960 ක වටිනාකමක් දන්වා ඇතත් අදාළ කමිටුව විසින් හඳුනාගත් තක්සේරු වටිනාකම වූ රු.10,918,970 ක් ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට නිර්දේශ කර තිබිය දී පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනයේ ඇමුණුම (ii) හි අලාභයේ වටිනාකම රු.16,519,961 ක් ලෙස දක්වා තිබුණි. තව ද මෙම අලාභය සිදුවී මෙම වාර්තාවේ දිනය වන විට දී වර්ෂ 07 ක් ඉක්මවා ඇතත් ද වගකිව යුතු පාර්ශව පැහැදිලිව හඳුනාගෙන රජයට සිදු වී තිබුණු අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ කාර්යයන් පහසුකිරීමට කාර්ය මණ්ඩලය වෙත ලබාදී තිබූ යතුරු පැදි අතරින් 2009 මාර්තු 12 දින මාතර ධීවර කාර්යාලයේ නිලධාරියෙකු වෙත ලබා දී තිබූ රු.116,030 ක් වටිනා යතුරු පැදියක් 2011 සැප්තැම්බර් 21 දින මාතර දිස්ත්‍රික් ධීවර කාර්යාලය තුළ තිබියදීම අස්ථානගතවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1) යටතේ සිදුකර ඇති විමර්ශනය ප්‍රකාරව රු.77,740 ක මුදලක් එම නිලධාරියාගෙන් අයකර ගැනීමට 2012 මැයි 10 දින නිර්දේශ කර ඇතත් විගණිත දිනය වන විටත් එකී අලාභය අයකරගෙන නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවට අයත් රු.66,900 ක් වටිනා SAMSUNG A.8.0 ටැබ් යන්ත්‍රයක් 2024 සැප්තැම්බර් 02 දින අස්ථානගතවීම සම්බන්ධයෙන් සිදුකරන ලද මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයේ දින රහිත වාර්තාව ප්‍රකාරව රු.56,865 ක් අදාළ නිලධාරිනියගෙන් අයකර ගැනීමට නිර්දේශ කර ඇතත් මෙම වාර්තාවේ දින දක්වාම එම මුදල අයකරගෙන නොතිබුණි.

**4.4 කළමනාකරණ දුර්වලතා**

(අ) වෙරළබඩ ප්‍රදේශයේ මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සිනෝර් ආයතනය මගින් සකස්කරන ලද FAD සහ බස්රථ යොදාගෙන මත්ස්‍ය අපද්‍රව්‍ය නිවාරණය යනුවෙන් ව්‍යාපෘති 02ක් සැලසුම් කර රු.මිලියන 40 ක් ඇස්තමේන්තු කර තිබුණද ඉන් රු.මිලියන 20 ක් පමණක් වැය කරමින් සිනෝර් ආයතනය මගින් සකස්කරන ලද FAD ව්‍යාපෘතිය පමණක් ඉටුකර එම ව්‍යාපෘතිය වඩාත් සාර්ථක ක්‍රමවේදය බවට තහවුරු වීම යනුවෙන් විගණනය වෙත හේතු දක්වා තිබුණද එහි සාර්ථක බව ඇගයීමේ ක්‍රමවේදය කුමක්ද යන්න විගණනයට අනාවරණය නොවීය.

(ආ) දියවර දිරිය අදියර I ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් 755 ක් සඳහා රු.මිලියන 1,031 ක ණය මුදලක් ලබා දී ණය ගෙවීම් පැහැර හරින ලද පුද්ගලයින් 31 දෙනෙකුගේ නොගෙවූ ණය ප්‍රමාණය රු.17,085,752 ක්වූ අතර දියවර දිරිය අදියර II ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් 1,027 ක් සඳහා රු.මිලියන 1,822 ක ණය මුදලක් ලබා දී ණය ගෙවීම් පැහැර හරින ලද පුද්ගලයින් 85 දෙනෙකුගේ නොගෙවූ ණය ප්‍රමාණය රු.94,848,481 ක් වී තිබුණි. ඒ අනුව අදියර දෙකෙහි දීම ණය ගෙවීම් පැහැර හරින ලද පුද්ගලයින් 116 ක් නොගෙවූ මුළු ණය ප්‍රමාණය රු.111,934,233 ක් වී තිබුණි. අදියර I හා අදියර II සඳහා පිළිවෙලින් රු.3,731,930 ක් හා රු.4,065,181 ක් ලෙස එකතුව රු.7,797,111 ක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අක්‍රිය ණය සඳහා 2023 පෙබරවාරි දක්වා පොලී සහනාධාරය ලෙස ගෙවීම් කිරීම බැංකුව සමඟ මනා සම්බන්ධීකරණයක් නොමැතිකම හේතුවෙන් රාජ්‍ය මුදල් නිකරුණේ වැය කිරීමක් බව නිරීක්ෂණය විය.

**4.5 වත්කම් කළමනාකරණය**

රු.2,268,325,531 ක්වූ දෙපාර්තමේන්තුව සතු ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් CIGAS වැඩසටහනේ ඇතුලත් කර පවත්වාගෙන යනු ලබන වත්කම් ලේඛනයේ ඇතුලත් විය යුතු අත්‍යාවශ්‍යම කරුණු වන වත්කම් අත්පත් කරගත් දිනය, එක් එක් වත්කම හඳුනාගැනීමේ අනුක්‍රමික හා කේත අංක, වත්කම පවතින ස්ථානය යන තොරතුරු නිවැරදිව වාර්තා කර නොතිබුණි.

**5. මානව සම්පත් කළමනාකරණය**

**5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

(අ) දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 11 කට අදාළව පුරප්පාඩු 22 ක් සහ එක් තනතුරකට අදාළව අතිරික්ත සේවක සංඛ්‍යාව 01 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 02 කට අදාළව පුරප්පාඩු 04 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 13 කට අදාළව පුරප්පාඩු 244 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 කට අදාළව පුරප්පාඩු 07 ක්ද පැවතුණි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටම ද ඇතුලුව තනතුරු 28 කට අදාළව පුරප්පාඩු 277 ක් පැවති බව නිරීක්ෂණය වූ අතර එම කාර්යය මණ්ඩලය උපරිම කාර්යක්ෂමතාවයෙන් දායක කරගැනීම සඳහා කාර්යය මණ්ඩල සමාලෝචනයක් කර නොතිබුණි.

(ආ) කාර්යාල සේවක සේවයේ නිලධාරීන් 10 ක් තාවකාලික පදනමින් සේවයේ යොදවා ඇතත් එම තනතුර සඳහා පුරප්පාඩු 04 ක් පැවතිය ද තාවකාලික පදනමින් නිලධාරීන් 10 ක් සේවයේ යෙදවීම තුළින් 2025 වර්ෂයේ නිලධාරීන් 06 ක් අතිරික්තව සේවයේ යොදවා තිබුණි.

**5.2 අභ්‍යන්තර ස්ථානමාරු ප්‍රතිපත්තිය**

(අ) දෙපාර්තමේන්තුවේ 2018 මාර්තු 31 දින සිට ක්‍රියාත්මක අභ්‍යන්තර ස්ථානමාරු ප්‍රතිපත්තිය අනුව නිලධාරියකු එක් දිස්ත්‍රික්කයක සේවය කළ යුතු උපරිම සේවා කාලය වසර 05 ක් වන අතර එක් කොට්ඨාසයක/ එක් සේවා ස්ථානයක/ එක් අංශයක උපරිම සේවා කාලය වසර 03 කි. තව ද 2018 මාර්තු 31 දිනට සේවා ස්ථානයක/ දිස්ත්‍රික්කයක වසර 10 කට වැඩි කාලයක් අඛණ්ඩව සේවය කළ නිලධාරීන් 2018 වසර තුළම අභ්‍යන්තර ස්ථානමාරු කිරීමට කටයුතු කරන බව දෙපාර්තමේන්තුවේ දැනට ක්‍රියාත්මක අභ්‍යන්තර ස්ථානමාරු ප්‍රතිපත්තියෙහි දක්වා තිබුණ ද උක්ත ස්ථාන මාරු ප්‍රතිපත්තියට පටහැනිව 2005 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කර 2025 දෙසැම්බර් 31 දින වන විට පළමු සේවා ස්ථානයේම වසර 20 කට වැඩි කාලයක් සේවය කළ නිලධාරීන් 24 දෙනෙකු සිටින බව විගණනයට නිරීක්ෂණය විය.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ආ) නිලධාරීන් 06 දෙනෙකු දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කළ පසු එක් දිස්ත්‍රික්කයක සේවය කර ස්ථානමාරු ලබා නැවතත් පෙර සේවය කළ දිස්ත්‍රික්කයටම ස්ථානමාරු ලබා විගණිත දින වන විට වසර 7 සිට 18 ක කාලයක් සේවය කරමින් පැවතුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කර විගණිත දින වන විටත් පළමු සේවා ස්ථානයේම වසර 10-15 ත් අතර කාලයක් සේවය කළ නිලධාරීන් 28 දෙනෙකු ද, වසර 5-10 ත් අතර කාලයක් සේවය කළ නිලධාරීන් 66 දෙනෙකු ද සිටින බව විගණනයට නිරීක්ෂණය විය.

(ඈ) වර්තමාන සේවා ස්ථානයේ වසර 15-20 ත් අතර කාලයක් සේවය කළ නිලධාරීන් 09 දෙනෙකු ද, වසර 10-15 ත් අතර කාලයක් සේවය කළ නිලධාරීන් 06 දෙනෙකු සහ වසර 5-10 ත් අතර කාලයක් සේවය කළ නිලධාරීන් 24 දෙනෙකු ද සිටින බව විගණනයේ දී නිරීක්ෂණය විය.

පි.කේ.එම්.පි.නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පි.කේ.එම්.පි. නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය